# යථාර්ථයක් බවට පත් කර ගත යුතු අපේම ඛනිජ තෙල් සිහිනය

**චාමින්ද හෙට්ටිආරච්චි**
අතිරේක ලේකම් (සංවර්ධන)
බලශක්ති අංශය
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය


ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් පවතින්නේ ද යන්න මීට දශක ගණනාවකට පෙර සිටම මෙරට ජනතාව අතර කතා බහට ලක් වූ මාතෘකාවකි. සමහරුන් පවසන ආකාරයට එය හුදු දේශපාලන ප්‍රකාශයක් පමණි. අනෙක් අතට එය ඉතා සරල කාර්යයක් ලෙස අර්ථ ගන්වන්නෝ ද සිටිති. එබැවින් ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු පිළිබඳව මෙරට පොදු ජනතාව වෙත නිවැරදිව කරුණු දැනුවත් කිරීමේ වගකීමක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් වෙත නිවැරදි කරුණු සැපයීමේ අරමුණින් මෙම සටහන තබමි.

දැනට අප රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවය 100%ක්ම ආනයනය මත රඳා පවතින අතර එයින් පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් යන ප්‍රධාන ඛනිජ තෙල් වර්ග තුන මෙරට ආර්ථිකය හසුරුවන එක් මූලික අංගයක් බවට පත්ව ඇත. දෙමුහුම් (හයිබ්‍රිඩ්) හා විදුලි මෝටර් රථ වෙළඳපොළේ තිබුණ ද එය ඛනිජ තෙල් මත යැපෙන මෝටර් රථ සංඛ්‍යාව අඩු කිරීමට දක්වන දායකත්වය සීමිත ය. විදුලිබල ජනනය සහ පොදු ප්‍රවාහන සේවය සඳහා ඩීසල් අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත. ධීවර අමාත්‍යාංශයේ වාර්තා අනුව වර්තමානයේ භූමිතෙල් ධීවර යාත්‍රා 25000ක් පමණ පවතින අතර සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව ආලෝකය ලබා ගැනීම සඳහා භූමිතෙල් පාවිච්චි කරන පවුල් සංඛ්‍යාව 25000කටත් වැඩිවේ. මෙකී අවශ්‍යතා සපුරාලනු ලබන ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉහත කී පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් යන ඉන්ධන තුන පමණක් මිලදී ගැනීම සඳහා 2019 වසරේදී දරන ලද වියදම රුපියල් බිලියන 375 පමණ වේ.

ආනයනය මත පමණක් රඳා පැවතීම නිසා විදේශ වෙළඳපොළෙහි සිදුවන මිල උච්චාවචනයේ සෘජු බලපෑමට ශ්‍රී ලංකාවට යටත් වීමට සිදුවේ. තවද ඩොලරය ඉදිරියේ ලංකා රුපියල අවප්‍රමාණය වීමද ඩොලර් මිල දී ගැනීමේ දී අතිරේක පොලියක් ගෙවීමට සිදුවීම ද රටෙහි ආර්ථිකය කෙරෙහි ඇති කරන්නේ අයහපත් බලපෑමකි. පවත්නා ගබඩා පහසුකම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් හා ආනයනික ඛනිජ තෙල් සම්බන්ධයෙන් දේශීයව පවත්නා ඉල්ලුම හැකි තරම් නිවැරදිව පුරෝකථනය කරමින් නිවැරදි අවශ්‍යතාවය පදනම් කරගත් ඛනිජ තෙල් ආනයනික යාන්ත්‍රණයක් දැනට ක්‍රියාත්මක වේ.

ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා දිගින් දිගටම වර්ධනය වන ඉල්ලුමක් පැවතිය ද ගෝලීය සංදර්භයන් සලකා බැලීමේදී අමතක

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් ගවේෂණයට අදාළ සියලු කටයුතු මෙහෙයවන්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (Petroleum Resources Development Secretariat) විසින් වන අතර එය වර්තමානයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.



කළ නොහැකි ඛනිජ තෙල් මතම රැඳී පැවතීමේ සීමාවන් දෙකක් අප හමුවේ පවතින බව නිරීක්ෂණය වේ. ඉන් පළමුවැන්න නම්, සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා වන උපාය මාර්ග යක් ලෙස තිරසාර බලශක්ති මිශ්‍රණයක් (Sustainable Energy Mix) කරා නැඹුරුවීමේ අවශ්‍යතාවයයි. ඒ අනුව ඛනිජ තෙල්වලට අමතරව ජලවිදුලිය, සුළං, සූර්ය තාපය, ස්වභාවික වායු, මුහුදු රළ, න්‍යෂ්ටික ශක්තිය, ජීව වායුව ආදී බලශක්ති ප්‍රභවයන් ද ප්‍රමාණවත් පරිමාණයෙන් යුතුව යොදා ගත යුතුව තිබේ. දෙවැන්න නම්, තිරසාර බලශක්ති මිශ්‍රණයක් තුළ වුව ද පරිසරයට සිදුවන හානි අවම කරන සුපිරිසිදු බලශක්ති මූලාශ්‍ර කෙරෙහි යොමුවීමේ අවශ්‍යතාවයයි. ඒ අනුව සාපේක්ෂව වායුගෝලය කෙරෙහි අහිතකර බලපෑම අවම වූ ස්වභාවික වායුව (Natural Gas), සුළං බලය, සූර්ය තාපය වැනි ඉන්ධන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු කාලය එළඹ තිබේ. මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කරන අතරේ වුව ද වැඩිවන සංවර්ධන අවශ්‍යතා උදෙසා අඛණ්ඩ ඛනිජ තෙල් ඉල්ලුමක් මෙරට තුළ පවතින ආකාරයක් නිරීක්ෂණය වේ.

මන්නාරම් ද්‍රෝණියේ ඒ2 බිම් කොටස තුළ ඩොරාඩෝ (Dorado) සහ බැරකුඩා (Barracuda) නමින් හඳුන්වනු ලබන ඛනිජ තෙල් හා ස්වභාවික වායු මිශ්‍රිත නිධි දෙකක් පවතින අතර විධිමත් තාක්ෂණික ඇගයුම් ක්‍රියාවලියක් මගින් තෝරා ගන්නා ආයෝජකයෙකු වෙත කැනීම් කටයුතු පැවරීමට අදාළ කටයුතු දැනට සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සම්පත් ගවේෂණයට අදාළ සියලු කටයුතු මෙහෙයවන්නේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (Petroleum Resources Development Secretariat) විසින් වන අතර එය වර්තමානයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණ ප්‍රදේශ මන්නාරම් ද්‍රෝණිය, කාවරි ද්‍රෝණිය හා ලංකා ද්‍රෝණිය ලෙස කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. මන්නාරම් ද්‍රෝණිය ඒ2 නමැති බිම් කොටසේ ස්ථිර ලෙස ම ඛනිජ තෙල් හා ස්වාභාවික වායු නිධි පවතින බව 2011 වර්ෂයේ සිදුකරන ලද ගවේෂණවලින් සොයා ගෙන ඇති අතර ගවේෂණ බිම් කොටස් දැක්වෙන සිතියමක් මෙහි දැක්වේ.

එම සිතියමේ දැක්වෙන පරිදි මන්නාරම් ද්‍රෝණියේ ඒ2 බිම් කොටස තුළ ඩොරාඩෝ (Dorado) සහ බැරකුඩා (Barracuda) නමින් හඳුන්වනු ලබන ඛනිජ තෙල් හා ස්වභාවික වායු මිශ්‍රිත නිධි දෙකක් පවතින අතර විධිමත් තාක්ෂණික ඇගයුම් ක්‍රියාවලියක් මගින් තෝරා ගන්නා ආයෝජකයෙකු වෙත කැනීම් කටයුතු පැවරීමට අදාළ කටයුතු දැනට සිදු කරමින් පවතී. එමෙන්ම අනෙක් ප්‍රදේශවල ගවේෂණ කටයුතු ද විවිධ අදියරයන් යටතේ ක්‍රියාත්මක වේ.

කෙසේවෙතත්, කැනීම් කටයුතුවල පවතින සංකීර්ණතාවය හමුවේ අපහට අපගේම ඛනිජ තෙල් හෝ ස්වභාවික වායු සම්පත් භුක්ති විඳීමට තවත් වසර තුනකවත් කාලයක් ඒ වෙනුවෙන් වූ අඛණ්ඩ මෙහෙයුම් කටයුතු ඉටු කරලීමට සිදුවේ. එය සැබෑවක් කර ගැනීම තුළ මෙම සටහනේ මුලදීම සඳහන් කළා වූ විදේශීය වෙළඳාමේ අහිතකර සාධකයන් සමනය කර ගැනීමට රටක් ලෙස අප වෙත

අවස්ථාව උදාවේ. එමෙන්ම ඉන්ධනවලට බලපාන නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු, අවදානම් දැරීමේ ගාස්තු ආදිය ද අවම කර ගැනීමේ අවස්ථාවක් හිමිවේ. තව ද මෙම ස්වභාවික සම්පත අවස්ථානුකූල පන්නරයක් කර ගනිමින් ඛනිජ තෙල් සම්පත් කැනීම් කටයුතු සඳහා මූලිකත්වයක් දීම තුළ දේශීය බලශක්ති නිෂ්පාදන වැඩ පිළිවෙල දිරිමත් කිරීමටත්, ඒ හරහා ජාත්‍යන්තර වශයෙන් පවතින ආර්ථික හා සමාජයීය සබඳතාවයන් පුළුල් කර ගැනීමටත් අවස්ථාව උදා වේ. එමෙන් ම, එම කාලය තුළ දී ස්වභාවික වායුව වැනි විකල්ප බලශක්ති ප්‍රභවයන්ගේ භාවිතය, නව ජාත්‍යන්තර වෙළඳාම් ආකෘතීන් වැනි සාධක හමුවේ වර්තමානයේ නොදකින වෙළඳපොළ තත්ත්වයන් නිර්මාණය නොවෙතැයි ද සිතිය නොහැකිය. එකී සියලු සාධකයන් විශ්ලේෂණය කරමින් අප රටට උපරිම වාසියක් ලබා ගැනීමට කටයුතු කළ හැකි පරිචයක් නිලධාරීන් ලෙස අප විසින් ගොඩ නගා ගත යුතුව තිබේ.

ආනයනය මත පමණක් රඳා පැවතීම නිසා විදේශ වෙළඳපොළෙහි සිදුවන මිල උච්චාවචනයේ සෘජු බලපෑමට ශ්‍රී ලංකාවට යටත් වීමට සිදුවේ. තවද ඩොලරය ඉදිරියේ ලංකා රුපියල අවප්‍රමාණය වීමද ඩොලර් මිල දී ගැනීමේ දී අතිරේක පොලියක් ගෙවීමට සිදුවීම ද රටෙහි ආර්ථිකය කෙරෙහි ඇති කරන්නේ අයහපත් බලපෑමකි. පවත්නා ගබඩා පහසුකම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් හා ආනයනික ඛනිජ තෙල් සම්බන්ධයෙන් දේශීයව පවත්නා ඉල්ලුම හැකි තරම් නිවැරදිව පුරෝකථනය කරමින් නිවැරදි අවශ්‍යතාවය පදනම් කරගත් ඛනිජ තෙල් ආනයනික යාන්ත්‍රණයක් දැනට ක්‍රියාත්මක වේ.

# රජයේ සේවා සැපයීමේ ක්‍රියාවලියට තොරතුරු තාක්ෂණය හඳුන්වා දීමේදී...

**එස්.ඩී. කොඩිකාර**
ලේකම්
නිවාස රාජ්‍ය අමාත්‍යාංශය

රජයේ සේවා සැපයීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව නැතහොත් ඵලදායීව ඉටුකිරීම සඳහා වත්මන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තොරතුරු තාක්ෂණය යොදාගත යුතු බවට තීරණය කිරීම අතිශයින්ම වැදගත් වේ. පූර්වයෙන් තොරතුරු තාක්ෂණය රජයේ සේවා සැපයීමේ ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ හිටපු ජනාධිපති ලේකම් සහ වත්මන් ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග මැතිතුමා අපගේ මතකයෙන් බැහැර නොවේ. තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම රාජ්‍ය සේවාවේ ඵලදායිතාවය තහවුරු කිරීමේ සංධිස්ථානයක් වනු නොඅනුමානය.

**ශක්තීන්**

ශ්‍රී ලංකාවේ රජයේ සේවා සැපයීමේ ක්‍රියාදාමයට තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම සඳහා තොරතුරු තාක්ෂණ සේවා නිලධාරීන් ප්‍රමාණවත් නොවූවද තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතාවය සහිත වෙනත් රජයේ සේවා සහ වෙනත් තනතුරු දරන්නන්ද සේවයේ යෙදී සිටි. වර්තමානයේ පරිගණක සාක්ෂරතාවය ඉහළ මට්ටමක පවතින අතර පරිගණක පහසුකම් දිවයිනේ සෑම රජයේ ආයතනයකම ප්‍රමාණවත් මට්ටමක පවතින බවද සත්‍යයකි. එනමුදු තොරතුරු තාක්ෂණය සේවා සැපයීමේ ක්‍රියාවලියට යොදාගැනීමේ යම් මන්දගාමී ස්වභාවයක් දැකිය හැකි වන්නේ ආයතන ප්‍රධානීන් නැතහොත් ප්‍රධාන කළමනාකරුවන් ඒ සඳහා දක්වන උනන්දුව අවම

වීම අකමැත්ත සහ අවම කැපවීමයි. තම ආයතනයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීනත්වයක් ඇති නිලධාරීන් හඳුනාගනිමින් ඔවුන්ගේ උපරිම සේවාව ලබා ගැනීම සඳහා ආයතන ප්‍රධානීන්ගේ මැදිහත්වීම මෙහිදී අත්‍යවශ්‍ය සාධකයකි.

**කඩදාසි රහිත විදේශ ශිෂ්‍යත්ව කළමනාකරණය**

වසර 2000 වනවිට ශ්‍රී ලංකාවේ විදේශ රජයේ නිලධාරීන් සඳහා වන විදේශ ශිෂ්‍යත්ව කළමනාකරණය පිළිබඳ රජයේ නිලධාරීන් තුළ පැවැතියේ අප්‍රසාදයකි. මන්දයත් සේවා සැපයීම සඳහා ගෘහ මූලිකයන් නොමැති අවස්ථාවල පවුල්වල තොරතුරු නිශ්චිතව ලබාගැනීමට නොහැකිවීමයි. නමුත් ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් සතුව ගෘහමූලිකයාගේ දත්ත පද්ධතියක්ද නොතිබූ බැවින් එවැනි ව්‍යසනයකදී පවුල් සහ එම සාමාජිකයින්ගේ තොරතුරු නිශ්චිතව සහ නිවැරදිව නොමැතිකමින් සේවා සැපයීම අතිශයින්ම දුෂ්කර කාර්යයක් විය.

මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගෘහමූලික පරිගණකාශ්‍රිත දත්ත පද්ධතියක් (Householders Database) හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය 2005 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (තොරතුරු තාක්ෂණ) වශයෙන් එය මවිසින් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතියේ ප්‍රතිඵල අපේක්ෂිත පරිදි ලබා ගැනීමට නොහැකිවූයේ එවකට රාජ්‍ය සේවකයින්ගේ පරිගණක සාක්ෂරතාවය සහ පරිගණක පහසුකම් අවම මට්ටමක පැවතීම සහ ආයතනික ප්‍රධාන කළමනාකරුවන්ගේ කැපවීම, උනන්දුව හා ඒ පිළිබඳ පැවති විශ්වාසය අවම වීමයි. එනමුත් සමහර ග්‍රාම නිලධාරීවරුන් එකී උත්සාහය නිසි පරිදි ප්‍රයෝජනයට ගනිමින් තම ග්‍රාම නිලධාරී වසමේ සමස්ත ගෘහමූලික තොරතුරු පරිගණකාශ්‍රිතව රැස්කර ගැනීම සඳහා කටයුතු කළ බවද සීමිත ප්‍රාදේශීය ලේකම්වරුන් සංඛ්‍යාවක් එකී දත්ත භාවිතා කරමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට අනුගත වූ බවද මෙහිදී කිව යුතුය.

මෙම ව්‍යාපෘතිය තවදුරටත් සරල සහ තාක්ෂණික වශයෙන් වඩාත් දියුණු කළ ව්‍යාපෘතියක් වශයෙන් ඉලෙක්ට්‍රොනික ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය (eGrama Niladari) 2017 වර්ෂයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගාල්ල, බදුල්ල, කුරුණෑගල සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ක්‍රියාත්මක කරන ලදී. එය අතිශයින් සාර්ථක නියමු ව්‍යාපෘතියක් විය. මන්ද ඒ බව ඉතාමත්ම කෙටි කාලයක් තුළ දුක්ගැනවිලි ඉදිරිපත් කළ සේවාලාභියාට කෙටි පණිවිඩයක් මගින් දැනුවත් කිරීමටත් හැකියාව ලැබුණි.

එසේම විදේශ අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය සමග ගාල්ල දිසාපතිවරයා වශයෙන් මා ක්‍රියාත්මක කළ ඉලෙක්ට්‍රොනික සහතික ලියාපදිංචි කිරීමේ නියමු ව්‍යාපෘතිය (e - Document Registration) යටතේ,

- ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයන් විදේශ අධ්‍යාපනය ලබා ගැනීමේදී තම නිල සහතිකපත් විදේශීය අධ්‍යනායතනයන් වෙත යොමුකිරීමටත්,
- වීසා ලබා ගැනීමේදී යම් නිල සහතිකයක් තානාපති කාර්යාලයකට ඉදිරිපත් කිරීම සඳහා කොන්සියුලර් අංශය මගින් සහතික කරගත යුතුනම්, එවැනි කාර්යයන් ඉතාමත්ම කෙටි කාලයක් තුළ සිදු කිරීමටත්,

එනම් සේවාලාභියෙකුට කොළඹට නොපැමිණ තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අදාල සහතික පත් අන්තර්ජාලය ඔස්සේ විදේශ අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත යොමුකිරීමට අවස්ථාව සැලසිනි.

ඒ ආකාරයට ගාල්ල කුරුණෑගල සහ යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල 2017 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ නියමු ව්‍යාපෘතියන් ද සාර්ථක කරගත හැකි වූ බව කිව යුතුය. එමගින් දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට කොළඹ විදේශ අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයට පැමිණෙන සේවාලාභීන් සංඛ්‍යාව අවම කිරීමටත් ඔවුන්ගේ කාලය සහ මුදල ඉතිරි කර දීමටත් තොරතුරු තාක්ෂණය මගින් හැකිවූ බව පෙන්වා දිය හැකිය.

**සුවිශේෂී අවධානයට**

තොරතුරු තාක්ෂණය මගින් රජයේ සේවා සැපයීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන නියෝජිතායතනයේ (ICTA) මැදිහත්වීම අතිශයින් වැදගත් වේ.

එසේම කාර්යාලවල සේවය කරන තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන් මෙන්ම තොරතුරු තාක්ෂණය ප්‍රගුණ කර ඇති වෙනත් සේවාවන්ට සහ තනතුරු වල නිරත වන සෙසු රාජ්‍ය සේවකයින් ගේ මැදිහත්වීම, විශේෂයෙන්ම ආයතනවල ප්‍රධාන කළමනාකරුවන්ගේ උනන්දුව, කැපවීම, නිර්මාණශීලීත්වය සහ අවශ්‍යතාවය අතිශයින්ම තීරණාත්මක සාධක බව මවිසින් ක්‍රියාත්මක කිරීමට මැදිහත් වූ ඉහත සඳහන් තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීමේ ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට දරන ලද ප්‍රයත්නයේ දී මා ලද අත්දැකීම් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුමය.



කාලානුරූපීව මානවයා තම සිත්හි තිබෙන අදහස් ප්‍රකාශ කිරීමට විවිධ මාධ්‍ය යොදාගත්හ. ගල්ගුහා වල ඇඳි රූප වලින් ඇරඹි එකී ප්‍රකාශනය චිත්‍ර, සෙල් ලිපි හරහා අක්ෂරයටත්, පසුව පුස්කොළ වලටත් අනතුරුව කඩදාසියටත් පරිවර්ථනය විය. එහි නූතන විකාශනයේ එක් ප්‍රමුඛ වේදිකාවක් ලෙස මුහුණු පොත හඳුනාගත හැකිය.

පරිපාලන සේවයේ එදා සිට අද දක්වාම විවිධ සාහිත්‍ය අංශයන්හි දායකත්වයත්,ප්‍රතිභාවත් දැක්වූ විශාල පිරිසක් සිටි අතර අද ද එහි වෙනසක් නොවේ. නූතන සමාජ මාධ්‍ය යොදාගනිමින් සිය අත්දැකීම් සහ සංකල්ප, අදහස් ඉදිරිපත් කරන සේවයේ සිටින සහ විශ්‍රාමික පරිපාලන සේවයේ බොහෝ පිරිසක් වෙති.

එසේ මුහුණු පොතෙහි පල කරන ලද සිය ගණනක් වූ අදහස් අතුරින් කිහිපයක් අදාල නිලධාරීන්ගේ අවසරය ඇතිව, පරිපාලන සේවා සංගමයේ වාර්ෂික මහ සභාවට සමගාමීව නිකුත් කරන සඟරාවේ නව අංගයක් ලෙස සංස්කරණයකින් තොරව ඇතුලත් කිරීමට සංස්කාරක මණ්ඩලය තීරණය කරන ලදී.

එකී නැවුම් අදහස්, අත්දැකීම්, රාජ්‍ය සේවය ගැන මුල් බැස තිබෙන සෘණාත්මක සිතුවිලි වෙනස් කිරීමත්, සේවාවේ ප්‍රභාව වැඩි දියුණු කිරීමට මෙන්ම නවක නිලධාරීන් අභිප්‍රේරණයට ද ඉවහල් වනු ඇතැයි අදහස් කරමු.

# කල්තොට ගස් රැක ගන්නට නම්

**චම්පික නිරෝෂ්**
ප්‍රාදේශීය ලේකම්
ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය




කල්තොට දියුණු විය යුතුය.. හම්බෙගමුවේ සිට ලේන් දෙකක මගක වේගයෙන් එන අයට ගස් වැවුනු තනි මාර්ගයක කිලෝ මීටර් පහක් යාම කරදරකාරී විය හැක. හිටපු ඕඅයිසී මට ලිපියකින් දැන්වූ ලෙසටම අනතුරු වන්නටද ඉඩ තිබේ.

අප දැක්වූ විරෝධය ගස් කැපීමේ විරෝධයක් පමණක් නොවීය. ගස් නොකපා හදන්නට පාරක්ද අපි පෙන්වූයෙමු. ආර්ථිකව පාඩු නොවෙන, පාලම් නවය වෙනුවට පාලම් දෙකක් පමණක් ඇති, ගම මැදින් වැටෙන, දැනටමත් ඇති එල්ලෙන පාලම ඉවත්කර සහ පරිසරයට ගැලපෙන පාරක් යෝජනා කලෙමු.

අප යෝජනා කල පාර නිසා දල වශයෙන් රුපියල් ලක්ෂ 1505කට ආසන්න පිරිවැය ඉතිරියක් ලැබෙන බව ඉංජිනේරු මහතා ගණනය කලේය. ඇගයීමකට ලක් නොවුනත් ඔහු සුන්දර පරිසරකාමී ඉංජිනේරු වරයෙකි. ඔහු කල අධ්‍යයනයට කිසිවෙක් ගෙවීම් කලේ නැත.

මේ ගස් ගැන වෙහෙසෙන්නට හේතු රැසකි. කල්තොට අයත්වන්නේ ඉපැරණි රුහුණටය.. එහි නීල මහා යෝධයා ඉදිකල අමුනේ කොටස් තවමත් ඇත. සමනල වැවේ ඇතිවූ කාන්දුව දල වශයෙන් කල්තොට වගා කටයුතුවලට අවශ්‍ය ප්‍රමාණයට ආසන්න අගයක් වීමම දෙවියන්ගේ බැල්ම කල්තොටට ඇති බවට හේතුවකැයි ජනතාවගේ විශ්වාසයයි. කන්න දෙකම වගා කරන අතර අතරමැදි කන්නයද වගා කර

මුංඇට අස්වැන්නක් රටට එකතු කරන අහිංසක ජනතාවක් එහි වාසය කරති..

එක්වරක් හෝ මේ මාර්ගයේ ගියහොත් මේ ගස් ගැන ආදරයක් ඇතිවීම වලක්වන්නට නොහැක. කාවෙක් පොත් දෙස බලන ආකාරයට මේ ගස් දෙස බලන්නට හැක්කේ ගස් මුදලාලි කෙනෙකුට පමණි.. කර්මය වන්නේ ලංකාවේ ගස් මුදලාලිලාගෙන් සමහරුන්ට "දේශපාලනඥයින්" කියාද කියන නිසාය. ඔවුන්ට පහසුවෙන් රජයේ මුදලින් "ව්‍යාපෘති, ආපදා, අනතුරුදායක, මුල් දිරාගොස්, මැරී ගොස්.." වැනි ටැග් එකකින් ගස් කපන්නට හැකිය.

මෙයින් එක් කුඹුක් ගසක් පැලවී ඇත්තේ ගල් කණුවක් වට කරගනිමිනි. එය කපන්නටම ඕනෑ බව පාර හදද්දී මට දැනුම් දෙන ලදී. එකල අපේ කාර්යාලයේ සිටි වත්මන් කොළොන්න ප්‍රාදේශීය ලේකම් Amila Wijerathne සොහොයුරා විශ්‍රාමික පරිපාලන ග්‍රාම නිලධාරී Wijesena Perakatiya මහතා සහ කල්තොට සියළු ව්‍යාපෘති වලදී බර අදින Tmn Karunasena මහතා මැදිහත්ව ගස රැකගත් බව මතකය.. (නිමල් අයියාගේ මතය වන්නේ එම ගස ගැන නිදන් වදුලක තිබෙන බැවින් ගස ඉවත් කරන්නටම තීරණය කලා වන්නට ඇති බවය.) අදටත් එම ගසද නිරුපද්‍රිතව තිබේ..


අප සැකසූ විකල්ප මාර්ග ව්‍යාපෘති වාර්තාව මෙහි අමුණනු හැර වෙන යමක් කරන්නට මට නොහැක. එය වැදගත්වන තීරණ ගත හැකි අයෙකු කරා ලඟා කරවන්නට ඔබට හැකියි. ඒ වෙනුවෙන් යමක් කරන්නට ඔබටද ආරාධනා කරමි. මේ දිනවල දෙන පොරොන්දු අතරට කල්තොට නව මාර්ගය ඇතුලත් කරන්නට හැකිනම් මේ සුන්දර සෙවන තව පනස් වසරක් රැකගන්නට හැකිවනු ඇත. අමතරව ලැබෙන වාසි අවසාන පිටුවේ ඇතුලත් බැවින් එයද කියවන්න..


අප සැකසූ විකල්ප මාර්ග ව්‍යාපෘති වාර්තාව මෙහි අමුණනු හැර වෙන යමක් කරන්නට මට නොහැක. එය වැදගත්වන තීරණ ගත හැකි අයෙකු කරා ලඟා කරවන්නට ඔබට හැකියි. ඒ වෙනුවෙන් යමක් කරන්නට ඔබටද ආරාධනා කරමි. මේ දිනවල දෙන පොරොන්දු අතරට කල්තොට නව මාර්ගය ඇතුලත් කරන්නට හැකිනම් මේ සුන්දර සෙවන තව පනස් වසරක් රැකගන්නට හැකිවනු ඇත.

අප මේ වාර්තාව සැකසුවේ මාර්ගය තනි ලේන් එකක් ලෙස හදන්නටත් පෙරදීය.. ඒ වනවිට අදාල කොටසට කිසිදු මුදලක් වැය වී තිබුනේ නැත.. එකල මෙහි පිටපත් බොහෝ තැන් වලට යැවූවත් අඩුම තරමින් ඒ ගැන වැඩිදුරට සලකා බලන්නට කිසිවෙකුට ඇවසි නොවීය. අපේ විරෝධය නොතකා අපට බනිමින් අදාල කොටස තනි ලේන් එකකට සකසන ලදී.

කතරගම යන දිනක මේ පාරෙන් යන්න.. සිසිල විඳින්න.. හිතේ හැටියට නාගෙන පිරිසිදු වන්න.. සමනල වැව, තංජම වැව, ඇඳගල, දූවිලි ඇල්ල, බුදුගල, ගල්ටැම් යාය, කූරගල සහ හඳගිරිය උඩවලව වනජීවී උද්‍යාන පිවිසුම ආදිය නරඹන්න.. පරිසරයට කිසිවක් නොදමා යන්න.. විශේෂයෙන් හිස් බෝතල්, පොලිතීන් නොදමන්න..

මේ විකල්ප පාර හදන්නට හැකිවූ දවසක ගස්ටික ආරක්ෂිතයි.. නැතිනම් "ඩබල් ලේන් සංවර්ධනය"ට ගස්ටික බිලි වේවි.


කල්තොට
Search this area
UVA PROVINCE
SABARAGAMUWA PROVINCE
altota CB,
ation Dept
Divineguma Communit
Based Bank - Kalthota
B528
කල්තොට පොලිසිය
කල්තොට රෝහල
Google


Pambahinna
nalawewa Reservoir
Causeway
Uggalkaltota
Kurugala
Causeway
Irrigation Cannel
Weli ova
Walawe Ganga
Bodagama Kalthota Road (B-528)

**Estimation of the cost for Existing Road Widening**


| Item | Description | Unit | Qty | Rate | Amount |
|---|---|---|---|---|---|
| 201(1) | Clearing and Grubbing (assume 5.0 m for both side) | $m^2$ | 19,150.00 | 44.62 | 854,473.00 |
| 301(1) | Road way excavation (assume 100 mm depth & 4.0 m width) | $m^3$ | 1,532.00 | 703.25 | 1,077,379.00 |
| 304(1) | trim level & compact original ground ( for above 201(1) & 304 (1) | $m^2$ | 34,470.00 | 87.30 | 3,009,231.00 |
| 304(2) | Embankment construction Type 1 (2.0 $m^3$ per 1m) | $m^3$ | 7,660.00 | 1,843.00 | 14,117,380.00 |
| 304(3) | Embankment construction Type 2 (3.5$m^3$ per 1m) | $m^3$ | 13,405.00 | 1,649.00 | 22,104,845.00 |
| 401(1) | Sub Base as compacted in a position (assume 200 mm height , 4.0m width | $m^3$ | 3,070.40 | 2,134.00 | 6,552,233.60 |
| 405(1) | Dense graded aggregate base (assume 200 m , 8.0 m) | $m^3$ | 6,128.00 | 5,626.00 | 34,476,128.00 |
| 409(1) | Earthen shoulder as compacted in position | $m^3$ | 1,407.53 | 1,891.50 | 2,662,333.54 |
| 501(1) | Bituminous Prime Coat using MC 30 | $m^2$ | 30,640.00 | 174.60 | 5,349,744.00 |
| 501(2) | Bituminous Tack Coat using cationic emulsion | $m^2$ | 30,640.00 | 74.69 | 2,288,501.60 |
| 506(1) | Asphalt concrete in binder (assume density as a 2.34 Ton /m 3) | MT | 3,584.88 | 15,132.00 | 54,246,404.16 |
| 506(2) | Asphalt concrete in binder | $m^2$ | 30,640.00 | 1,998.20 | 61,224,848.00 |
| Total Estimated amount for the carriageway widening and over laying without structure | | | | | **207,963,500.90** |

**Estimation of the cost for proposed Re construction Road**

| Itam | Description | Unit | Qty | Rate | Amount |
|---|---|---|---|---|---|
| 201(1) | Clearing and Grubbing (assume 5.0 m for both side) | $m^2$ | 7,000.00 | 44.62 | 312,340.00 |
| 301(1) | Road way excavation (assume 300mm depth & 8.0 m width) | $m^3$ | 3,360.00 | 703.25 | 2,362,920.00 |
| 304(1) | trim level & compact original ground ( for above 201(1) & 304 (1) | $m^2$ | 15,400.00 | 87.30 | 1,344,420.00 |
| 304(2) | Embankment construction Type 1 (0.5 x 10.6x1400 m) | $m^3$ | 7,420.00 | 1,843.00 | 13,675,060.00 |
| 304(3) | Embankment construction Type 1 (1.0 x 11.5x1400 m) | $m^3$ | 16,100.00 | 1,649.00 | 26,548,900.00 |
| 401(1) | Sub Base as compacted in a position (assume 300 mm height , 8.0m width | $m^3$ | 3,360.00 | 2,134.00 | 7,170,240.00 |
| 405(1) | Dense graded aggregate base (assume 200 m , 8.0 m) | $m^3$ | 2,800.00 | 5,626.00 | 15,752,800.00 |
| 409(1) | Earthen shoulder as compacted in position | $m^3$ | 514.50 | 1,891.50 | 973,176.75 |
| 501(1) | Bituminous Prime Coat using MC 30 | $m^2$ | 11,200.00 | 174.60 | 1,955,520.00 |
| 501(2) | Bituminous Tack Coat using cationic emulsion | $m^2$ | 11,200.00 | 74.69 | 836,528.00 |
| 506(1) | Asphalt concrete in binder (assume density as a 2.34 Ton /m 3) | MT | 1,310.40 | 15,132.0 0 | 19,828,972.80 |
| 506(2) | Asphalt concrete in binder | $m^2$ | 11,200.00 | 1,997.20 | 22,368,640.00 |
| | If it is need soft ground treatment can use Rock filling (assume all length 1400 x.6x10 ) | $m^3$ | 8,400.00 | Assume 5,000.00 | 42,000,000.00 |
| Total Estimated amount for the carriageway widening and over laying without structure | | | | | **155,129,517.55** |

**Retaining wall Cost calculation**

Assume foolowing section need to be construct as a Retaining wall



| Bill no | Pay item | Description | Unit | Qty | Rate | Amount |
|---|---|---|---|---|---|---|
| 6.2.5 | 302(5)& 302(8) | Excavation and backfilling with suitable material for structures | Cum | 0.80 | 1,804.20 | 1,443.36 |
| 6.2.6 | 302(6) | Providing sand bed under foundation | Cum | 0.00 | 3,404.70 | - |
| 6.2.7 | 1008(2) | Rough finish formwork | Sqm | 3.00 | 1,804.20 | 5,412.60 |
| 6.2.8 | 1008(1) | Smooth finish formwork | Sqm | 2.30 | 2,357.10 | 5,421.33 |
| 6.2.9 | 1002(1) | Suppliying, bending and laying Tor steel (460 N/mm2) as reinforcment | Ton | 0.01 | 201,760.00 | 2,283.92 |
| 6.2.10 | 1002(1b) | Suppliying, bending and laying Mild steel (250 N/mm2) as reinforcment | Ton | 0.00 | 201,760.00 | - |
| 6.2.11 | 1001(3) | Grade 15 /40 screed concrete and reaining walls | Cum | 1.95 | 13,851.60 | 27,010.62 |
| 6.2.12 | | Grade 20 /20 concrete for Retaining walls | Cum | | 16,247.50 | - |
| 6.2.13 | 1001(2) | Grade 25 /20 concrete for culverts, wing walls, head walls, cutoff walls etc... | Cum | 0.45 | 17,460.00 | 7,857.00 |
| 6.2.14 | 706(1) | Weep holes using type 600 PVC pipes of 100 mm dia | Lm | 0.15 | 1,590.80 | 238.62 |
| 6.2.15 | 705(1) | Aggregate back fill | Cum | 0.15 | 4,457.15 | 668.57 |
| 6.2.16 | 705(2) | Filter medium | Cum | 0.15 | 4,457.15 | 668.57 |
| 6.2.17 | 705(3) | Imppervious layer | Sqm | 0.30 | 412.25 | 123.68 |
| Total cost of the 1.0 m length of the Assumed Retaining wall section | | | | | | 51,128.27 |

| CHAINAGE | STRUCTURE | HIGHT OF Stru.(H/m) | Length (L/m) |
|---|---|---|---|
| 41 + 495 - 41 + 510 | RW - (LHS) | 1.25 | 15 |
| 41 + 600 - 41 + 617 | RW - (LHS) | 1.40 | 17 |
| 42 + 307 - 42 + 320 | RW - (LHS) | 1.50 | 13 |
| 41 + 260 - 41 + 300 | RW - (RHS) | 2.00 | 40 |
| 41 + 330 - 41 + 445 | RW - (RHS) | 2.00 | 115 |
| 41 + 620 - 41 + 680 | RW - (RHS) | 1.90 | 60 |
| 42 + 150 - 42 + 215 | RW - (LHS) | 1.50 | 65 |
| 44 + 220 - 44 + 265 | RW - (RHS) | 1.95 | 45 |
| 44 + 280 - 44 + 290 | RW - (RHS) | 1.90 | 10 |
| 44 + 340 - 44 + 390 | RW - (RHS) | 2.00 | 50 |
| 44 + 425 - 44 + 470 | RW - (RHS) | 2.00 | 45 |
| 44 + 900 - 44 + 915 | RW - (RHS) | 2.00 | 15 |
| 44 + 930 - 44 + 980 | RW - (RHS) | 1.70 | 50 |
| 45 + 085 - 45 + 150 | RW - (RHS) | 1.80 | 65 |
| 45 + 155 - 45 + 190 | RW - (RHS) | 1.95 | 35 |
| 42 + 350 - 42 + 397 | RW - (RHS) | 2.15 | 47 |
| 44 + 280 - 45+150 | RW - (LHS) | 3.00 | 870 |
| | | | 1557 m |

According to the site condition 1557 m of retaining wall proposed

∴ Assumed total cost for 1557 m retaining wall section = 79,606,721.37

# Proposal for an Alternative Section for 41 km to 45 km

Local Bank Funded Project

*Rehabilitation and Improvement to Bodagama - Hambegamuwa - Kalthota Road*

RDA/DW/UWA/LBFP/2011/392



**Cost Calculation for overlay the existing carriage way up to 4m width with asphalt**

Assume 3800 m Need to overlay with the 50 mm thickness

Total Quantity for the overlaying = 1778.4 MT

| Item | Description | Unit | Qty | Rate | Amount |
|---|---|---|---|---|---|
| 506(1) | Asphalt concrete in binder (assume density as a 2.34 Ton /m 3) | MT | 1,778.40 | 15,132.00 | 26,910,748.80 |

**Total Saving of the Proposal for an Alternative Section**

| | | |
|---|---|---|
| Estimation of the cost for Existing Road Widening | = | 207,963,500.90 |
| Estimation of the cost for proposed Re construction Road | = | 155,129,517.55 |
| Estimation of the cost for Retaining walls | = | 79,606,721.37 |
| Cost for overlay the existing carriageway | = | 26,910,748.80 |
| Other saving from avoiding 3 Bridge widening | = | 15,000,000.00 |
| Saving from Property shifting and Service line Shifting | = | 30,000,000.00 |
| **Total Cost Saving** | = | **150,529,955.92** |

**Bodagama – Hambegamuwa- Kalthota Road ( B528 )**
**Proposal for an Alternative Section**

**Introduction**

As the section, beyond 43+000 km of the above road , which is now being improved is encountering many construction difficulties , as it is running along the existing Kaltota intersecting many irrigation canal structures and limited space availability due to the nature of the terrain for widening , the need for the study of an alternative road trace for the above section arose.

Accordingly we traversed the area along with villagers , well familiar of the geography of the area regarding it . Consequently we were able to find an alternative road trace, the villagers have been requesting ,which is detailed hereunder.

In the process of our engagement of the study, when the leading citizen of the area were consulted in this regard, we met Chief Priest of the village temple. He was so glad , when the matter was discussed and came out with his attempts made in the past in this regard to draw the attention of authorities to construct the road along the said trace. Accordingly he handed over to us copies of two letters, received by him from District Secretary, Ratnapura and Divisional Secretary , Balangoda (Copies attached) , recommending their proposal to RDA for consideration.


**Proposal**

The alternative road is named as" Dalpalama road", which starts from Chainage 0 +000km at Kaltota Junction and traverse mostly along existing village road and cross the Walave river at the place where a suspension bridge( Dalpalama) is located and links the existing village road on left bank and joins at Chainage of the existing road, being improved , , the place where RB canal is intersected.

**( See the attached Drawing of the proposed alternative Road section for detail.)**

In addition to the proposed alternative road, it is also proposed to overlay the existing carriage way up to 4m width with asphalt, not neglecting it for the benefit of the road users of it.

**Photograph of the proposed road trace**




Reference No



1. Walave Ganga ( Bridge proposed Location)



2. Proposed New Road Trace (Existing View)



3. Proposed New Road Trace(Existing Culvert)



4. Walave Ganga ( Bridge proposed Location)



5. Proposed New Road Trace(From Kalthota Junction)

**Advantages:**

1. The shortening of the road by 2430m
2. The avoidance of encountering of irrigation canals and appurtenant structures, which need to be either modified or extended with great difficulties of constructing high retaining walls due to limited space , rugged terrain and close proximity to the bank of Walawe river.
3. The avoidance of all cross drainages encountered on the road, as the proposed alternative road is running parallel to the river and crosses downstream below the points where drainage streams are joined on Walawe river..
4. The avoidance of the need of removal of huge trees located along the canal bund road , which is regarded as a serious environmental damage.
5. The avoidance of the need for shifting of HT and LT electricity posts and lines over a length of about 5km.
6. The avoidance of encounter of village water supply schemes.
7. The saving of money and time due to the reduction of the length, omission of the cost on shifting of utility services and less complication of works.
8. The fulfilling of the request of the villagers and High priest of the temple ,endorsed by District Secretary , Rathnapura.
9. The increase of more beneficiaries as a new road is constructed with a bridge across Walawe river in the area which is less developed in addition to the existing road which also needed to be improved on the available carriage width for the benefits of exiting beneficiaries.
10. The money thus saved can be used , for the extra works which will be required to improve the base failure of the pavement of the road section between km to -----km which has not been considered in the contract and else where needed .

**Disadvantage :**


1. The obtaining of approval from the authorities concerned as the existing road has been considered for the award of the contract.
2. The resentment of the public who are living close to the existing road, as an improved new road is denied to them.
3. Need to provide a long bridge encountering more earth filling asit is going through the point where the two drainage stream are met.
4. Hydrological study had to be carrying out for the new proposed road section.
5. New proposal cross through the paddy fields.
6. Need to do soft ground treatment for some area.
7. Public allegation and land acquiring difficulties

**Conclusion :**

When the merits and demerits are weighted , the new proposal is favored as it cuts the cost, length and the construction time. Further more that will meet the aspiration of most of the villagers represented by high priest of the temple . As no any construction works has been done yet on this section other than preliminaries such as topographic surveying, marking of the centerlines and pavement width and all , there will not be any loss and abandonment of works. Hence it is not too late to change the road . And also the omission of encounter of utility services which is regarded as a time consuming process in the road projects , is a major advantage.

# මීගමු කලපු බොරදියේ මාළු බෑම


**කපිල ජනක බණ්ඩාර**
අධ්‍යක්ෂ - සංවර්ධන
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය


**බො**රදියේ මාළු බෑම හැම පෘතග්ජනයෙකුගේම ගතියක්. මේ වෙලාවේ බොර වුනු දියේ මාළුවෙක් බාගන්න මාත් හිතුවා. මං අල්ලා ගන්න බලාපොරොත්තු වෙන්නේ ලොකු මෝරෙක්!

ඒ තමයි මේ වෙලාවේ ජනප්‍රියම ප්‍රශ්තුතය වෙන මීගමු කලපු ව්‍යාපෘතිය ජනප්‍රිය කරවන එක! අපි කරන කලපු සංවර්ධන ව්‍යාපෘතිය ජනප්‍රිය කරවන එක.

ලංකාවේ කලපු සහ මෝය ආශ්‍රිත ප්‍රදේශ 116 ක් තියෙනවා. මේ ප්‍රදේශ පාරිසරික වශයෙන් අතිශයින්ම සංවේදී කලාප. වෙරළ හා ගොඩබිම යා කරන අන්තර් කලාපයක් වන කලපු සම්බන්ධයෙන් ලංකාවේ සංවර්ධනයේ දී අවධානය යොමු වෙලා තියෙන්නේ හරිම අඩුවෙන්. ඇත්තටම, විද්‍යාත්මක අධ්‍යනයන් හැර මේ කලපු පවිත්‍ර කරන්න; අනවශ්‍ය ලෙස ගොඩවීම වළක්වන්න; හා දූෂකයන්ගේ ග්‍රහණයෙන් මුදා ගන්න අපි රටක් විදිහට කිසිම දෙයක් නොකළ තරම්.මේ නිසා අපේ රටේ සමහර කලපු "මළ කලපු" බවටව පත්වෙමින් පවතින බව රටේ බොහෝ දෙනෙක් දන්නේ නෑ. පුත්තලමේ මුන්දල් ලේක්, මුලතිව්වල නන්දිකඩාල් හා කෝකිලායි වගේ කලපු සම්බන්ධයෙන් මේ අවධානම ඉතාමත් ඉහළයි. ඒ ආශ්‍රිතව සිදුවූ සිදුවීම් රැසක් 2010 වසරෙන් පසුව වාර්තා වෙලා තියෙනවා.

මේ තත්වය අවධානයට ගනිමින් ලංකා ඉතිහාසයේ පලමු වතාවට කලපු සංරක්ෂණය, පවිත්‍ර කිරීම හා සංවර්ධනය සුවිශේෂී අරමුණක් කර ගනිමින්, ඒ සඳහාම වෙන් වූ කිසියම් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු බවට 2013 වසරේ දී යෝජනා කළා. එහි ප්‍රතිඵලයක් විදිහට ඒ වසරේ අය වැය මඟින් රුපියල් බිලියනයක්

වෙන් කළා. මේ මුදල වෙන් කළේ මීගමුව කලපුවට. ඒකට හේතු ගොඩක් තියෙනවා.

1. පාර්ශවකරුවන් සම්බන්ධයෙන් ගත්තම ලංකාවේ සංකීර්ණම කළපුව මීගමුව කළපුව
2. වැඩිම අනවසර අල්ලා ගැනීම් තියෙන කලපුව
3. ශීඝ්‍රයෙන් දූෂණය වෙන කලපුව
4. කටුනායක ගුවන් තොටුපොල, ගුවන් හමුදා කඳවුර, මීගමුව මහ රෝහල, මීගමුව මහ නගර සභාව, කටුනායක සීදූව නගර සභාව, කටාන, ජාඇල ඒකල හා වත්තල යන ප්‍රාදේශීය සභා ඇතුළු පලාත් පාලන ආයතන 05 ක් වගේම නිදහස් වෙළඳ කලාපයේ අප ජලය හා කසල බැහැර කිරීමේ තර්ජනයට ලක් වුනු කලපුව
5. ධීවර කර්මාන්තය අතරින් වැඩිම සංවේදිතාවක් සහිත කලපුව
6. සංචාරක කර්මාන්තය අතින් වැඩිම අවධානයට ලක් වෙන කලපුව
7. ඒ වෙනකොට, ඒ කියන්නේ 2012 අවුරුද්ද විතර වෙනකොට "මළ කලපුවක්" බවට පත්වීමේ අවධානම සහිත කලපුව ඇතුළු තවත් නිර්ණායක රැසක් මේ තෝරා ගැනීමට හේතු වුනා

ඊළඟ වැදගත්ම කරුණක් තමයි, ලංකාවේ කලපු සම්බන්ධයෙන් Master Plan එකක් හදලා සංරක්ෂණය හා සංවර්ධනය කරන්න ප්‍රවේශය ගත්තේ මීගමු කලපු ව්‍යාපෘතියෙන්. උපදේශක ආයතනය වුනේ ලංකාවේ බොහෝ සංවර්ධන ගැටළු සඳහා නිර්මාණාත්මක පිළිතුරු දුන් සහ දෙමින් සිටින මොරටුව විශ්ව විද්‍යාලය.

අනෙක් කරුණ මේ ව්‍යාපෘතිය "අතිශය ඉවසීමෙන්" ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් වීම. කලින් කිව්ව විදිහට සංකීර්ණ වටපිටාවක් එක්ක බොහෝම ඉවසීමෙන් හා සීරුමාරුවට ගණුදෙනු කරමින් කටයුතු කරන්න සිද්ධ වුනා. ඒ සඳහා අපි මේ ව්‍යාපෘතිය අදියර කිහියකට සැලසුම් කළා. මුළු ව්‍යාපෘති වටිනාකම බිලියන 10 ක්. පළමු අදියරය බිලියනයක්. එහෙම කළේම සංකීර්ණතාවට මුහුණ දීමේ උපක්‍රමයක් විදිහට.

මොරටුව විශ්ව විද්‍යාලය සිය සැලසුමේ දී බොහෝම විද්‍යාත්මක එළඹුමක් යොදා ගත්තා. ඒ වගේම, එහි මහාචාර්යවරු ඇතුළු සැලසුම් කණ්ඩායම, බොහෝ දෙනෙකුගේ; ඒ කියන්නේ ජාතික සහ ප්‍රාදේශීය දේශපාලඥයින්, ප්‍රජාව, විවිධ සංවිධාන, පරිසර සංවිධාන, ව්‍යාපාරිකයින්, රාජ්‍ය ආයතන වගේ ගොඩක් දෙනෙකුගේ හිංසාවට ලක් වුනා. එක්තරා ඇමැතිවරයෙක් මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකුට "ඔය මහාචාර්යකම ගහ ගනින් ...." කියලත් කිව්වා.

ඒත්, අපි ඒ කිසිම කරුණක් එතරම් තැකුවේ නෑ. අපේ අරමුණ පැහැදිලියි. අපිට ඕන කවර ආකාරයෙන් හෝ ව්‍යාපෘති අරමුණු ළඟා කර ගන්න. අරමුණු තමයි මීගමු කලපුව මළ කලපුවක් වීම වැළැක්වීම, කලපු පවිත්‍රතාව ඇති කිරීම; දූෂණය වීම වැළැක්වීම; අනවසර අල්ලා ගැනීම් වැළැක්වීම; කලපුව ආශ්‍රිතව ජීවත් වෙන ධීවර ප්‍රජාව ඇතුළු සියල්ලන්ටම යහපත් කලපුවක් නිර්මාණය කිරීම, මේ කලපුව ඇසුරෙන් ජාතික ආර්ථිකයට ලොකු දායකත්වයක් ලබා දීම වගේ ගොඩක්.

මං මේ ව්‍යාපෘතියේ සංකල්පීය යෝජනාව 2014 වසරේ සකස් කරන්න දායක වුනු කෙනෙක්. ඒ යෝජනාව සකස් කරන්න උදව් කරපු අය ගොඩක් ඉන්නවා. ආයතන ගොඩක් තියෙනවා. ඒ අතරින් IUCN එකත්, නාරා ආයතනයත්, ධීවර දෙපාර්තමේන්තුවත් විශේෂයි. IUCN එක කඩොලාන සඳහා ඉහළම කැපවීමක් කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ජාත්‍යයන්තර ආයතනයක් (හැම ජාත්‍යයන්තර ආයතනයක්ම ජාත්‍යයන්තර කුමන්ත්‍රණකාරයෝ නෙවෙයි).


ඒ සංකල්පීය යෝජනාව සඳහා අපි ක්‍රියාකාරකම් 15 ක් අඳුනා ගත්තා. ඒඅතරින් 5, 8, 11 හා 14 මෙහි අනුපිළිවෙලින් දක්වා තියෙනවා. ඒ හතරම පාරිසරික සංරක්ෂණයට අතිශයින්ම අදාලයි. 11 ඍජුවම කඩොලාන හා සම්බන්ධයි.

වර්තමානයේ අපි සංවර්ධනය සම්බන්ධයෙන් කතා කරනකොට යොදා ගන්න වැදගත්ම සංකල්ප දෙකක් ගැන මං මෙතනදි ඔබේ අවධානය යොමු කරවන්න කැමැතියි.

1. තිරසර සංවර්ධනය
2. ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය

මං පෞද්ගලිකව විශ්වාස කරන දෙයක් තමයි "ප්‍රජාවෙන්" පරිබාහිර "තිරසර" සංවර්ධනයක් නැති බව. පෙර සඳහන් කරපු "ඉවසීම" ඉතාමත් වැදගත් වෙන්නේ මෙන්න මේ ප්‍රජා සහභාගීත්වය තහවුරු කරන්නයි. මං නිතරම ප්‍රජාවට ඉහළින්ම ගරු කරන කෙනෙක්. ඔවුන් තුළ ඇති නිධන්ගත දැනුම හෙවත් Tacit Knowledge කියන එක වෙන කිසිම මූලාශයකින් ගන්න බැරි බව විශේෂඥයෝ තදින් පිළිගන්නවා.

මෙතනදී අපි මතක තියා ගන්න ඕන කරුණක් තමයි පරිසරය සම්බන්ධයෙන් ලෝක ඉතිහාසයේ වැදගත්ම ප්‍රකාශය කළ සියැට්ල් රතු ඉන්දියානු ගෝත්‍රිකයෙක් බව. ඔහු කිසිදු විශ්ව විද්‍යාලයකින්, මොනම උපාධියක්වත් ලබාගෙන නොතිබුණත්, ඔහු නූගත් ගෝත්‍රිකයෙක් වෙන්නේ නෑ. ලංකාවේ බොහෝ උගතුන් දැනුමේ දර්ශනය (Philosophy of Knowledge) දන්නේ නෑ. ඒ නිසා, සංවර්ධන විශේෂඥයා නිතරම ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුමට සාවධානව සවන් දෙනවා.




වර්තමානයේ සිදුවන සාකච්ඡාව ඇතුළේ සිදුවෙන ඉතාමත් නරක හා අවාසනාවන්ත කරුණ තමයි මීගමුව කලපු සංවර්ධන ව්‍යාපෘතිය "කඩොලාන කපමින්" "සෙල්ලම් පිට්ටනි හදන" ව්‍යාපෘතියක්ය වගේ මතයක් සමාජගත වීම.

අපේ ක්‍රියාකාකරකම් 15 පිංතූරයක තියෙනවා. බලන්න පුළුවන්. මේ ක්‍රියාකාරකම් දෙකම මේ ව්‍යාපෘතියේ නැහැ. අපි කඩොලාන කපන්නේම නෑ. ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පයේ මහ ගෙදර වන මොරටුව විශ්ව විද්‍යාලයේ Architectural Department එක කඩොලාන වනය, ව්‍යාපෘතියේ සැලසුම් එක්ක මනාව බද්ධ කරමින් සිය සැලසුම් සකස් කළා. අපි මේ ව්‍යාපෘතිය මගින් එකම එක කඩොලාන ගහක්වත් කැපුවේ නෑ. කපන්නෙත් නෑ.

පෙර කී ආකාරයයට මං මගේ රාජකාරි ජීවිතයේ නිලධාරියෙක් විදිහට මුහුණ දුන් දුෂ්කරම අවස්ථා රැසක් මේ ව්‍යාපෘතියෙන් මතු වුනා. මං විතරක් නෙවෙයි, අපේ මුළු ව්‍යාපෘති කණ්ඩායමම. ඒත්, රජයේ නිලධාරීන් විදිහට අපිට මහජනතාව කෙරෙහි වන වගවීම අත්හරින්න බෑ. ඒ නිසා අපි අරමුණු වෙනුවෙන් ඉවසීමෙන් වැඩ කරනවා.

2019 ලෝක රග්බි තරගාවලියේ දී ඉතාමත් අපේක්ෂාසහගත, බලගතු හා රග්බි ලෝකයේ දැවැන්තයන් වුනු නවසීලන්තය පහසුවෙන් පරාද කරන්න එංගලන්තයට පුළුවන් වුනා. ඒ ජයග්‍රහණය තමාට අතිශය අවාසි සහගත වටපිටාවක දී ලබන්න එංගලන්තයට පුළුවන් වුනේ " අරමුණු සහගතවීම" නිසා. තරගය අතරතුර සිදුවූ පසු බැසීම් පවා ඒ ජයග්‍රහණයේ කොටසක්. වැදගත්ම දේ වුනේ පසු බැසීම් වලදී ජයග්‍රහණය සම්බන්ධ අරමුණ අත් නොහැරීම හා ඒවාට ධෛර්යයෙන් මුහුණ දීම. මං රජයේ නිලධාරියෙක් එගලන්ත රග්බි කණ්ඩායම වගේ වෙන්න ඕන කියලා ඒ දවස්වලම හිතුව.

රජයේ නිලධාරියෙකු ජනප්‍රිය විය යුතු යැයි මං විශ්වාස කරන්නේ නෑ. එහෙම වෙන්න ඕනම නෑ. මොකද අපිට නිතරම පැවරෙන්නේ කිසියම් සංකීර්ණ අරමුණක් ජයගණය කරවීම. ඒ නිසා විදින්න සිදුවෙන අපහාස, උපහාස, විවේචන බොහෝම ඉවසීමෙන් විඳ ගන්න අපි පුරුදු වුනා. දැනුත් විඳිනවා. අනාගතයේදීත් එහෙමම වේවි.

ඒ නිසා මං මගේ චෝලයේ කියවන හා අදහස් පල කරන අයගෙන් කරන්නේ එකම ඉල්ලීමක් විතරයි.


ඒ පදනම් විරහිත චෝදනාවන්ගෙන් මීගමුව කලපු සංවර්ධන ව්‍යාපෘතිය නිදොස් කොට නිදහස් කරන්න.

- Revise Negombo lagoon management regulation according to the needs identified through a survey
- Establish recycling process for the burned fuel and other toxic by product release to the lagoon
- Introduce proper mangroves conservation programme
- Demarcate the lagoon limits with additional buffer zone

1. Conduct stock assessment and resource assessment in order to define the limits of fishing effort
2. Establish proper data collection and reporting system of fish catch and other fisheries related aspects
3. Identify the illegal and none sustainable fishing gears used in the lagoon and name those as not suitable gears in order to remove the same from the lagoon
4. Provide alternative livelihood options to those who use the illegal gears and conduct awareness programme in order to introduce eco-friendly gears identified using a proper survey
5. Revise Negombo lagoon management regulation according to the needs identified through a survey
6. Develop 80 small scale landing sites (for none mechanized boats) with minimum required facilities
7. Develop access roads to the small scale landing sites
8. Establish recycling process for the burned fuel and other toxic by product release to the lagoon
9. Deepening the water canals associated with the lagoon and removing the additional silt deposits
10. Conducting studies on invasive species such as bivalves, algae and water plants in order to establish procedure to minimize the spreading of the same species
11. Introduce proper mangroves conservation programme
12. Conduct studies on identifying most suitable locations to conduct aquaculture practices
13. Identify the growing grounds of fish (i.e Malakana and Arakku thotupala for shrims) and establish closed areas in order to develop the fishing resources and conservation of the same
14. Demarcate the lagoon limits with additional buffer zone
15. Integrate the tourism development activities with fisheries sector and acquire the concurrence of the fisheries organization of the lagoon before implementation of such activities

## Study Area:

- ***Relevant Local Authorities:***
  - Negombo MC
  - Wattala PS
  - Katana PS
  - Katunayake – Seeduwa UC
  - Ja Ela PS



# කොළඹට ගංවතුර...
# විසඳුම අත ළඟ

**චම්පික නිරෝෂ්**
ප්‍රාදේශීය ලේකම්
ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය




2016 ගංවතුර එද්දී මගේ දුව කරවනැල්ල රෝහලේය. අඟුරුවැල්ල මගේ නිවසට තිබූ සියලු ප්‍රවේශ අවහිරවිය. රාජකාරි කල බලංගොඩට නාය අවදානම නිකුත්කර තිබූ බැවින් එහි නැවතී සිටීමද කල යුතුවිය. සතියක් පුරාවට බලංගොඩ සිට බගවන්තලාව නෝටන් ලක්ෂපාන කලුගල යටියන්තොට හරහා ගල්පාත පාරෙන් ගෙදර එන්නටද යලි යන්නටද සිදුවිය. ඒ මෝටර් සයිකලයකිනි. මුලු ගමන පුරාම තෙමෙමින් දිනපතා දෙවරක් සීතල කඳුකරයේ බයිසිකල් පැදීම විෂ්ණු දෙවියන්ට බටකොල කන්නට සිදුවීම සමග සමපාත කර ප්‍රාදේශීය ලේකම් ගර්වය හිතින් මැඩගතිමි.

යන එන ගමන් හිතට ආ විකාර අදහස් සහ කුඩා අධ්‍යයනයක් සමග පහත අදහස මගේ බිත්තියේ ඇමිනුවෙමි.

https://www.facebook.com/champika.nirosh/posts/1319783658091531

**කොළඹට ගංවතුර එන්නේ ඇයි? නවත්වන්න බැරිද?**

ගඟක් ඉහලට ගලනවා දැක තිබේද? මේ සිතියම් යොමුව ගූගල් මැප් එකේ ත්‍රිමානව බලන්න.. මෙහි ඇති terrain map එක O/L සමාජ අධ්‍යයනය දැනුමෙන් කියවාගන්න...

මේ කරුණු වෙන වෙනම සැලකිල්ලට ගන්න..

1 කැළණි ගඟ ආරම්භයේ සිට කරවනැල්ල දක්වා පහලට ගලා ගොස් රුවන්වැල්ල දක්වා හරහට/ඉහලට ගලාගොස් රුවන්වැල්ල පොල ලඟින් යලි හැරී කොළඹ දක්වා ගලන බව.




2. කැළණි ගඟ හරහට ගලා යලි පහලට ගලන්නට පටන් ගන්නා තැනට ගුරුගොඩ ඔය වැටෙන බව.
3. ගුරුගොඩ ඔයට අගුරුවැල්ලට ඉහලින් රිටිගහඔය වැටෙන බව.
4. කැළණි ගඟ ඉහලින් ලක්ෂපාන විදුලිබලාගාර සංකීර්ණය කාසල්රී, මාඋස්සාකැලේ ඇතුලු විවිධ ප්‍රමාණයේ ජලාශ විස්සක් පමණ ඇති බව සහ වැසි වැඩිවන අවස්ථාවලදී එම ජලාශවල වාන් දොරටු හරිනවිට කැළණි ගඟ දිගේ පහලට ජලය වේගයෙන් ගලාවිත් කරවනැල්ලේදී වේගය අඩුවී ගලායාම සම්පූර්ණයෙන් නවතිනබව.
5. එසේ නවතින ජලය ගුරුගොඩ ඔය හා රිටිගහ ඔයෙන් එන ජලය සමග එක්ව දයිගල සහ මොරලිඔය කඳු අතර කුඩා කපොල්ලක් තුලින් ගලායාමට නොහැකිව මහා ජලාශයක් ලෙස එකතුවී දින දෙකක් පමණ රැඳී තිබෙන බව.


ගුරුගොඩ ඔය සහ රිටිගහ ඔයේ විවිධ මට්ටම්වල ඇති කුඩා ජල විදුලි බලාගාර විසි ගනනකින් කිසිදු දැනුම්දීමකින් තොරව නිදහස්කරන රඳවාගත් ජලය නිසා ජලකඳ තවත් විශාල වන බව.


6. දින දෙකක් රැඳී තිබෙන ජලකඳ දයිගල සහ මොරලිඔය කඳු අතර කපොල්ලෙන් පහලට ගලා ගොස් සීතාවක ගඟේ ජලයද සමග එක්වී කොස්ගම හංවැල්ල කඩුවෙල හරහා කොළඹ දිස්ත්‍රික්කයද පූගොඩ බියගම හරහා කැළණිය හා පැලියගොඩ ඇතුලු ගම්පහ දිස්ත්‍රික්කයද යට කරන බව.
7. දින දෙකක් කරවනැල්ලේ සිට වරාවල දක්වා පිරී නිසලව රඳන ජලය තව දින පහක් දයිගල සහ මොරලිඔය කඳු අතර කපොල්ල හරහා ඉදිකලහැකි කෙටි වේල්ලක් සහ දොරටුවක් මගින් පාලනය කරමින් නිදහස් කලහොත් කොළඹ ගංවතුර ගැටලුව විසඳෙන බව.
8. එසේ ජලාශයක් ඉදිකලොත් රැඳෙන ජලය මගින් කොළඹ සහ ගම්පහ සහිත Western Megapolis මහානගරය සඳහා අඛන්ඩ ජල සැපයුමක් ලබාදීම කලහැකිවන බැවින් අමතර ප්‍රතිලාභ ලැබෙන බව.
9. එසේ රඳවාගන්නා අමතර ජලය දීඇල්ලේ ඔයට සහ මාඔයට සම්බන්ධ කරන උමං මාර්ග මගින් ගම්පහ, වේයන්ගොඩ, මීරිගම, මීගමුව හා ජාඇල ප්‍රදේශවල ඇති ජල ගැටලුවට පිලියම් යෙදිය හැකිබව.
10. විදුලි ජනනය කිරීමටද යම් හැකියාවක් ඇති බව.
11. මෙම යෝජනාව සලකා බැලෙන දිනයක Gamini Ekanayaka සහ මම සිය පවුල් සමග අනාථ වන බව.


මේ බහුබූත ජ්ලෑන මම මහාචාර්ය Jun Koo වෙතට ඉදිරිපත් කලාම ඒ යකා දාහක් ප්‍රශ්ණ අහල A plus එකක් Assignment එකට දුන්නා.. (දැන් ඒක මගෙ ලග නෑ..)


මේ වගේ බහුබූත අදහස් එන අපිව එල්ලල දාන්න නීති ගේන්න කියා මම ඉල්ලා සිටිනවා..

(අපට අවශ්‍ය තාක්ෂණික කරුණු ප්‍රතිපත්ති බවට හැරවියහැකි ක්‍රමවේදයන් බවත් එවැනි අය බිහිකිරීමකින් තොරව දෙන කිසිදු විසඳීමක් ප්‍රතිඵලදායක නොවන බව අවසන් වශයෙන් සඳහන් කරමි.)


DIALOG 3G
9:29 PM
38%
google.com
Search Google Maps
A21
Ruwanwella
Karawanella
කරවනැල්ල
Kurupetta-Daigala-Gurugalla Rd
A7
Google


DIALOG
8:02 AM
94%
google.com
Search Google Maps
Moraliya Ganaga Boda Rd
Magammana-Kurupetta-Daigala Gurugalla
B603
Kelani Ganga River
Google


DIALOG 3G
9:30 PM
38%
google.com
Search Google Maps
A21
Ruwanwella
Moraliya Ganaga Boda Rd
Magammana-Kurupetta-Daigala-Gurugalla Rd
Karawanella
A7
Daigala
Google


DIALOG 3G
9:27 PM
39%
google.com
Search Google Maps
A21
B457
Ruwanwella
Yatiyanthota
A7
Karawanella
කරවනැල්ල
B603
Magammana
Google

ඒ සටහනට බොහෝ දෙනා අවධානය යොමු කල බව කිව යුතුය.. ඒ අතර ඉහල තනතුරු දරන රාජ්‍ය සේවකයෝ, මාධ්‍යවේදීහු, ඉංජිනේරු වෛද්‍ය අධ්‍යාපන සමාජ විද්‍යා වැනි ක්ෂේත්‍රවල ප්‍රවීනයෝද වූහ. ආයතන සංග්‍රහය පෙරලන්නට දන්නා ප්‍රාදේශීය ලේකම් කෙනෙක් දොඩවන බව සමහරු මූණටම කීවෝය.

දීනියස් එකතුවට මා කියූ කතාව ඇතුලත් කලේ මා හිතවත් Dharmasiri Wijewardana විසිනි. එහි සිටින දීනියස් වරයෙක් මා යෝජනා කරන ස්ථානය හරහා මුහුදු මට්ටමේ සිට 36.5 ක උසකින් සකසන බැම්මකින් ඇතිවන ජලාශයක් මගින් කොළඹ බේරාගන්නට හැකිබව පෙන්වා දී ඇතිබව දුටුවෙමි. එම එකතුවේ නොමැති උනන්දුවක් දක්වන්නන් හට දැනගන්නට ඒ සංවාදය උපුටා පල කරමි. මා නිවැරදි බව පෙන්වූ සියළු දෙනාට තුති.















දැන් ඇත්තේ හිතන්නට කාලයයි.. 2017 ගංවතුරට හානිවූ පැල්මඩුල්ලේ නිවෙස්වලට බෙදන්නට රුපියල් බිලියන ගනනක් මා වෙත ලැබෙන්නට නියමිතය.. ඒවා ගෙවන්නටත් පෙර 2018 ගංවතුරට එම ගෙවල්ම යටවෙමින් පවතී.. මෙසේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලට පසුගිය වසර දෙක තුල ගෙවා ඇති මුදල කොපමනද??

රුවන්වැල්ලේ මිනිසුන් බොහොමයක් අර්ධ නාගරිකයින් වන බැවින් ඉවත් වන්නට සුදුසු පහසුකම් සහිත එවැනි නව නගරයක් ලබා දේ නම් බහුතරය යන්නට අකැමති නොවනු ඇත.. රටක දියුණුව වෙනුවෙන් ගතයුතු තද තීරණ නොගෙන කල් දැමීම කල යුතු නොවේ..

අනාගත කොළඹ මෙගාපොලිස් පෙදෙසෙහි අනාගතය කැමැත්තෙන් හෝ අකමැත්තෙන් රඳන්නේ මේ ජලාශය ඉදිකිරීම තුල පමණි..

රුවන්වැලි සෑය ඉදිකරන්නට ස්වර්ණමාලිය ඉවත් කලේ කැමැත්තෙන්ද අකැමැත්තෙන්ද යන්න ගැන සාකච්ඡා පවතී.. ඒ කෙසේ වෙතත් රුවන්වැලි සෑය ලංකාවට ගෙනඑන අනන්‍යතාවය ස්වර්ණමාලියගේ විමානය තිබුනානම් ලැබෙන්නේ නැත.. ජලාශය ඉදිවේනම් මටද උන්හිටිතැන් අහිමිවන නමුත් මගේ නිවස නිසා රට සංවර්ධනය කිරීම නැවැත්විය යුතු නැත.

# රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ

**ඩබ්.ඒ.ඩී.එච්. කාංචන**
සහකාර ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය




1. රාජ්‍ය සේවයට අවශ්‍ය ප්‍රමාණය හා තනතුරු පිලිබඳව නැවත සමාලෝචනයක් සහ විද්‍යාත්මක පදනමක් සහිතව පුරෝකථනයන් ගොඩනැගීම.
2. මූලිකවම රාජ්‍යයේ වැයබරෙහි විශාල ප්‍රමාණයක් දරණ විශ්‍රාම වැටුප ක්‍රමය අහෝසිකර ඒ වෙනුවට දායකත්ව විශ්‍රාම වැටුපක් සහ අග්‍රහාර රක්ෂණ ආවරණය තවදුරටත් ශක්තිමත් කරමින් වඩා පහසුවෙන් ඒ කටයුතු සිදුකිරීම. එමෙන්ම විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ටද එවැනි රක්ෂණ ආවරණයක් හා ප්‍රථිලාභ ලබාදීම.
3. රාජ්‍ය සේවයට බඳවා ගැනීම වඩා විධිමත් කිරීම

   උදා: වාර්ෂික බඳවාගැනීම් තොරතුරු තාක්ෂණය පදනම් කරගෙන ඒ සඳහා යන වියදම් සහ කාලය අවම කරගැනීම
4. හුදු අමාත්‍යාංශ ප්‍රමාණය අඩුකල පමණින් අපේක්ෂිත පරිදි වියදම් හෝ කාලය අඩුවීමක් සිදුනොවේ. ඒ සඳහා මනා අධ්‍යයනයකින් යුතුව අවශ්‍යතාවය මත අමාත්‍යාංශ 30-35 අතර ප්‍රමාණයක පවත්වාගන්නා අතරම ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු , අධිකාරීන්, මණ්ඩල, සංස්ථා නිසි අධ්‍යයනයකින් අනතුරුව අවශ්‍ය පරිදි ඒකාබද්ධ කිරීම, අහෝසි කිරීම, ඇවර කිරීම හෝ නව ආයතනයක් යටතට පත්කිරීමට කටයුතු කිරීම.

   උදා: අමාත්‍යාංශ දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව නාමය ඒකාබද්ධ වුවද බොහෝ අවස්ථාවන්හිදී අදාල අමාත්‍යාංශය යටතේ ඇති අංශයන්හි ඒකාබද්ධ වීමක් හෝ සිදු නොවේ.

එකම කාර්යය සඳහා ආයතන ගණනාවක් පැවතීමත් ඒ ඒ ආයතන එකම ක්ෂේත්‍රයක් ආවරණය කරන්නා වූ නීති හඳුන්වාදීමත් හේතුවෙන් අවසාන වශයෙන් සේවාලාභීන් අපහසුතාවයට හෝ නොමගයැමට ඉඩකඩ ඇත.

5. රාජ්‍ය ආයතනවල වැඩ කටයුතු කිරීමේදී සහ ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු කිරීමේදී අවශ්‍ය සන්නිවේදනය,තේරුම් ගැනීම සහ සහයෝගය නොමැතිවීම හේතුවෙන් නිවැරදි ඉලක්ක වෙත ගමන් කිරීමට මෙන්ම සැබෑ ප්‍රතිපල සහ අගය ලබාගැනීමට නොහැකි වී ඇත. ඒ හේතුවෙන් ආයතන සම්බන්ධීකරණ ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය ක්‍රමවේද , ආයතනයක් හඳුන්වාදීම.

6. රාජ්‍ය සේවක පුහුණු ක්‍රියාවලින් අද ලෝකයට ගැලපෙන පරිදි සකස් කිරීම හා කාලීනව යාවත්කාලීන කිරීම. එමෙන්ම ඒ සඳහා තිබෙන ආයතන ප්‍රතිසංස්කරණයන්ට ලක්කිරීම සහ අවශ්‍ය නව ආයතන හඳුන්වාදීම.

7. රාජ්‍ය සේවයේ විශේෂයෙන්ම දීප ව්‍යාප්ත සේවා බඳවාගැනීමේදී ඉහල ගුණාත්වයකින් යුතුව සිදුකල යුතුය.ඒ සඳහාවන ක්‍රමවේදයක් කලාපීය ක්‍රමවේදයන් අධ්‍යනය කරමින් අපට ගැලපෙන ලෙස සකස් කිරීම සහ වඩා නිවැරදි බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කිරීම.

උදා ඉන්දියානු සිවිල් සේවයේ බඳවාගැනීම මෙන්ම සිංගප්පූරු හා මැලේසියානු ක්‍රමවේද මෙම අධ්‍යයනයට යොදාගතහැකි අතර සේවාවන්හි අවශ්‍යතාවය සහ පෙලගැස්ම ඒ අනුව නිර්මාණය කරගැනීමට හැකියාව ඇත

8. දැනට ක්‍රියාත්මක ජ්‍යෙෂ්ඨතාව මත පදනම් වූ උසස්වීම් ක්‍රමවේදය වෙනුවට දක්ෂතාව සහ හැකියාව මත පදනම්වූ උසස්වීම් සහ වැටුප වර්ධක ලබාදෙන ක්‍රමවේදයක් නිශ්චිත කාලරාමුවක් ඇතුලත හඳුන්වාදීම.

9. තොරතුරු තාක්ෂණ විසඳුම් නිසි පරිදි හඳුනා ගනිමින් රාජ්‍ය සේවයේ මීලඟ යුගය ඇරඹීමට කාලය පැමිණ තිබේ. විශේෂයෙන්ම කාර්යක්ෂමතාවය ඉහල නැංවීම මෙන්ම අවම ශ්‍රම බලකායකින් ඉහල ධාරිතාවයක් ලබාගැනීමේ අරමුණෙන් යුතුව මෙන්ම සමස්ථ රටේම සංවර්ධනයට මෙන්ම යහ පැවැත්මට බාධාවක් වී තිබෙන අල්ලස හා දූෂණය මැඩලීමටද මේ හරහා යම් දායකත්වයක් ලැබෙනු ඇත.

විශේෂයෙන් රාජ්‍ය ආදායම්, වියදම් මෙන්ම ව්‍යාපෘති ප්‍රගතිය නිසි පරිදි සමාලෝචනය කිරීම සඳහාද මෙවන් විසඳුම් යොදාගත හැකිය.

10. ඕනෑම මට්ටමේ රාජ්‍ය සේවකයෙකුට තම ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් නොවෙන පරිදි පුද්ගලික අංශයේ වසර 3 ක් සේවය කිරීමේ අවස්ථාව.

# IF

***Manjula Rajapakshe*** **(SLAS 111-2010)**
*Assistant Commissioner*
*Department for Registration of Persons*

*If you can keep your head when all about you*
*Are losing theirs and blaming it on you,*
*If you can trust yourself when all men doubt you*
*But make allowance for their doubting too;*
*If you can wait and not be tired by waiting,*
*Or being lied about, don't deal in lies,*
*Or being hated, don't give way to hating*
*And yet don't look too good, nor talk too wise;*

*If you can dream - and not make dreams your master;*
*If you can think - and not make thoughts your aim;*
*If you can meet with Triumph and Disaster*
*And treat those two impostors just the same;*
*If you can bear to hear the truth you've spoken*
*Twisted by knaves to make a trap for fools,*
*Or watch the things you gave your life to broken,*
*And stoop and build 'em up with worn-out tools;*

*If you can make one heap of all your winnings*
*And risk it on one turn of pitch - and - toss,*
*And lose, and start again at your beginnings*
*And never breathe a word about your loss;*
*If you can force your heart and nerve and sinew*
*To serve your turn long after they are gone,*
*And so hold on when there is nothing in you*
*Except the will which says to them: "Hold on!"*

*If you can talk with crowds and keep your virtue,*
*Or walk with kings - nor lose the common touch*
*If neither foes nor loving friends can hurt you,*
*If all men count with you, but none too much*
*If you can fill the unforgiving minute*
*With sixty seconds' worth of distance run*
*Yours is the earth and everything that's in it*
*And which is more - you'll be a man… my son.*

***(Poem by Rudyard Kipling)***

### *The lesson from the poem*

*The poet conveys his ideas about how to win this life, and after all, how to be a good human being. To be a good human being and to succeed in life, we should keep calm when other people around us are losing their cool. We should not lose our temperament even if others are blaming us for their fault. Keeping the head cool makes us think wisely to face those tough situations and ultimately a solution comes out.*

*We should have faith in ourselves, even when others doubt us. But after that, we should give some importance to their doubt too and try to find out what may be the reason for their suspicion. After all, 'To err is human'. So, by keeping faith in ourselves we make sure that we don't get demoralized or disheartened.*

*We should work hard and wait for the result patiently. We should not get tired by waiting. There are a number of real life examples where people missing big opportunities only by losing their patience. People may spread lies about us to others, but we should not indulge ourselves in lies. In other words, we should always remain truthful. If we are mislead or tempted to lie, people would ultimately discover the truth and won't believe us anymore. That's why it's important to speak the truth even if that hurts us. People may show their hatred towards us. Yet we should not hate them. We should show our love and respect to others.*

*We should not show us as too good a person or talk too wisely with common people, even after possessing such qualities. Having acquired all these good qualities mentioned above, people generally feel proud and tend to show off how good they are. But, we should not go that way. In that case, others would feel uncomfortable in our company and avoid us. Even others may try to prove us wrong at any cost, leading to an unhealthy competition.*

*To do something bigger, we should dream first. If dreams take the driver's seat, we may get detached from reality and eventually fail. We should be able to think over a matter, but should not make thoughts our aim. That is to say that we often lose our radar and get detached from the main point. So our thinking should not be scattered misleading us away from the target.*

*Life is a combination of success and failure, joy and sorrow, good times and bad times and we should accept both and face both situations similarly. People become too happy in success and forget their duty at hand. We may also get too complacent or proud at a small success, reducing our chances to reach higher goals. Again, at bad times, if we are too grieved, we may lose our faith and confidence. In both cases, our regular course of work is hampered. We should treat those deceivers similarly, with a smiling face.*

*We have to hold our nerves even after seeing that our favorite thing that we built with all our effort and time is broken. Then we have to pick up the scattered parts and build it all over again. This is another key for getting to the top of the world. To keep our cool is not easy in such a situation. But patience and the mental toughness would help us build them again.*

*We should stay in touch with people from every class of the society. We should be able to talk with common mass without losing our virtue or moral values. Again, we should be able to walk with kings without going beyond the reach of the common people. The common touch would help us realize the reality and feel the needs of the society. On the other hand, the noble touch would give us the power and opportunity to reach higher goals.*

*We should build ourselves strong enough, mentally and physically, so that neither enemies nor loving friends can hurt us. Moreover, we should develop healthy relationship with everyone around us, and should not allow anyone to harm us. We have to develop our personality in the appropriate way, so that everyone supports us and gives us importance.*

*If we allow someone to give us too much importance, we may be emotionally bound. That may restrict our freedom and prevent us from doing our duty. Or, we may be complacent thinking that we are so much liked by people, thus reducing our effort.*

*Time is precious. A minute is filled with sixty seconds. Time is here called unforgiving, as it waits for none and doesn't forgive him who wastes it. We should utilize every minute of our life in productive work. Wasting time is not something we can afford in our short lifespan.*

*Finally comes the achievement that we can get if we fulfill all the conditions mentioned so far. We can win this earth and everything in it. We can go to the top of the world and rule over everything. And what is more, we would be a complete and perfect human being. We should not forget that Kipling wrote this poem for his son, as it is addressed in the very last line. The poet wanted to show his son the right way to be a future leader. But it has inspired many a man in their journey of life on earth so far.*

# පිච්චෙන කොට සුදුපාට වෙන හක්ගෙඩි

2013 සංස්කෘතික අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියේ කෙටිකතා අංශයේ සම්මානය ලබා ගත් කෙටිකතාව.

**ලීලනාත් වික්‍රම ආරච්චි**
සහකාර මැතිවරණ කොමසාරිස්
පොළොන්නරුව දිස්ත්‍රික්කය

'මේ සෙල්ලම තවත් ඉවසන්න එපා බං... උඹටත් යන කලක් තියෙන්න ඕනි... අනික හිතපං උඹෙ පොඩි එකී ගැන... අරූටත් පිස්සුනෙ බං... නැත්තං ඔච්චර මොකද්ද...'

සීනි සීයකුත් අරං කඩෙන් එළියට බැහැපු පාර්වතී එක්ක ම ගෙවල් පැත්තට යන්න පිටත් වෙනගමං තබෝදිනී එහෙම කිව්වා. මේ කතාව ඉවර වෙන්නෙ අමාරුවෙන් හදාගත්තු හිත ආයෙමත් රිද්දගෙන කියල හිතුණු පාර්වතී කරබාගෙන පය ඉක්මන් කළා.

'යකෝ කසාද ගෑණි උඹ වෙච්චි එකේ මොනාද බං ඔය කුඩුකේඩු වැඩ?.. අනික උමාක්කලත් ඕවා කල්පනා කරන්න ඕනි.. පිරිමියෙක්ගෙ ඇඟක් බදාගෙන බුදියන එක නෙමෙයි බං මේ ලෝකෙ තියෙන එක ම රාජකාරිය.. කවදහරි මෙච්චර හින්දා රට්ටුන්ගෙන් කතන්දර අහන්නෙ අර කෙලි පැටව් තුන්දෙනා... වාට්ටුවෙ ඉඳන් ඊයෙ උඹ ගෙදර ආව ආරංචිය ආව ගමං මං මේක උඹට කියන්න හිතාගත්තෙත් ඒකයි.. දැන්වත් පාර්වතියෙ වෙලාවක සුන්දරේට කාරණාකාරණ කියල දීලා කුලියට හරි ගෙයක් අරං පලයං... උඹට බැයි ම නං මට කියපං... මං සුන්දරේ මල්ලි එක්ක තිවාඩු පාඩුවෙ කතා කරන්නං.. මං කොහොමත් කෙල්ල පැටිය බලන්න ඒ පැත්තෙ එන්න කියල හිටියෙ අද දවාලෙ...'

'අනේ තබෝවක්කෙ... ඉක්මණට තේ කහට ටික වක්කරල උදේට කන්න මුකුත් රත් කරන්න ඕනි බං.. මං ගිහිං එන්න ද? උදේ ම ගිහිං කුලීකාරයො දෙන්නෙක්වත් හොයාගෙන ගේ පිටිපස්ස කැල්ලෙ රතුළූණු ටිකක් වවන්න කියල හැදුවෙ අක්කේ'

'ඔව් ඔව්... තව හම්බ කරපං... ගෑල්ලමයිම තුන්දෙනෙක්නෙ... ලේසි

වෙන එකක් නෑ දීග දෙද්දි...අනේ උඹට කියන කට පාර්වතියෙ...'

කැම්පෙකේ ඉඳලා ආව දා හිටං ම ගමේ එවුන්ගෙන් වෙනසක් නැතුව පාර්වතී එක්ක කතා බහ කරන තබෝදිනීට හිනාවක් විසි කරලා පාර්වතී පය ඉක්මන් කළා ගෙවල් පැත්තට... තබෝදිනී අන්තිමට කිව්ව කතාව තරහට කිව්වත් හිත හොඳකමට කිව්වත් සීයට දෙසීයක් ඇත්තයි කියල පාර්වතී දැනං උන්න ඉර හඳ වගේ... එදා ගෑණු වාට්ටුවෙ ඉඳන් ආපු පිම්ම ඇගේ පතේ කැක්කුං ඔක්කොම පැත්තකට දාලා පාර්වතී උදැල්ල අරං ගේ පිටිපස්සට ගියේ ඔය කතාව හින්දම හිතට ආව හයිය අතපයට අරගෙන...

කෙල්ල ඇහැරෙන්න කළිං වතුර ටික රත්කරගන්න හිතං පාර්වතී හයියෙන් හුස්මක් ලිපට පිම්බා.. ඒ හුස්ම එක්ක පාර්වතී හංගං හිටිය හීං තනිකමකුත් ලිපේ ගිනි අඟුරු අස්සෙ පිච්චෙන හැටි බලං හිටිය පාර්වතීගෙ මූණ ගින්දර එළිය එක්ක දම්පාටට දිලිසුණා.

★ ★ ★ ★ ★ ★

පාර්වතී ඉස්කෝලෙ ගියෙ හයේ පන්තියට විතරයි. පාර්වතීගෙ තාත්තට  ඒ කියන්නෙ වේලායුදන්ට සංවිදානෙ එක්ක සම්බන්දකං තියෙනව කියල ගමේ හැමෝම දැනං හිටියා. ඒ කාලකණ්ණි දවසෙත් වේලායුදන් ගෙට ගොඩවෙද්දි පාර්වතී හිටියෙ උමාගෙ තිරුක්කුරල් විචාරය පොතක් කියවන ගමං...

"අඩිසිට් කිනියාලේ ඇන්පුඩය මාදේ..."

"ඇන්පුඩය නෙමෙයි ඊරි... ඇන්පුඩයෙ. උඹෙ ඇස් පේන්නෙ නැද්ද.."

"පඩි සොට් තවරාහ පාවායි අඩි වරුඩි පින් තුන්ගි මුන්නෙලුන්දු පේදයෝ"....

"මුන්නෙලුන්දු පේදෙයො.. හරියට කියපං නංගි.."

"මොකද්ද අක්කෙ මේකෙ තේරුම බං?"

"පැහෙන්නැතුව හිටපං.. උඹටත් කවද හරි ඔය වල්ලුවර් කියල තියෙන විදියට තමයි මිනිහෙක් එක්ක ඉන්න වෙන්නෙ..."

"අනේ කියපංකො අක්කෙ අගේ නොකර.. නෙදකිං උඹ නං..."

"ලොක්කියෙ... කටවහගනිල්ල දෙන්නම.." සිවගෝමි ගේ ඇතුළෙ ඉඳන් එළියට ආවෙ වේලායුදන්ගෙ බයිසිකලේ බෙල් එකේ සද්දෙට කන් දෙක ඇරගෙන.

වේලායුදන් ඒ ආවෙ පාර්වතී එක්කං යන්න කියල දැනගත්තු සිවගෝමී ලිප ගාව වාඩි උණේ ඇඳං හිටිය ලුංගියෙ කොනකිං නහය හූරන ගමං. ලිපේ හැඳිගගා තිබ්බා කඩල හොද්ද එක්ක ගතු කියන්න වගේ මොන මොනාද සට පට ගාලා අම්මගෙ කටින් පිට වෙනව පාර්වතී දැක්කා. කතා කරන්න හොඳ වෙලාවක් නෙමෙයි කියල තේරිච්චි පාර්වතී සද්ද නැතුව තාත්තගෙ බයිසිකලේ පොල්ල උඩින් වාඩිවෙලා සාය අකුලල කකුල් දෙක අස්සෙ පටලගත්තා. ආයිමත් තිරුක්කුරල් ඉගෙනගන්න පාර්වතී ඉස්කෝලෙ ගියේ නෑ.

සංවිදානෙන් ඇවිල්ල කෙල්ලෙක් කොල්ලෙක් අරගෙන යද්දි උන්ගෙ මහඑවුංගෙ පපු කොයිතරං පිච්චෙනවද කියල දැන දැනත් වේලායුදන් පාර්වතී බයිසිකලේ තියාගෙන බෝඩර් එකෙන් එහා කැලෑවට ඇදිච්චි කතාවට පහුවෙන්දා එළිවෙද්දි අත්තටු හම්බ වෙලා තිබ්බා. කවුරුත් කතා උණේ වේලායුදන් වගේ තිරිසන් තාත්තෙක් කොහෙවත් නැතුව ඇති කියල විතරයි.

★ ★ ★ ★ ★ ★

පාර්වතී සංවිදානෙට එකතුවෙලා අවුරුදු ගාණකට පස්සෙ දවසක උමා කසාද බැන්දා. වේලායුදනුත් සිවගෝමිත් මුරුහන් එක්ක උමා පයුරුපාසනං තියාගන්නවට කැමති උණේ ම නෑ. කවදාහරි දවසක තමං වගේ ම පාර්වතී වගේ ම මුරුහනුත් සංවිදානෙ එක්ක එකතු වෙනව කියල වේලායුදන් නිච්චියට ම දැනං හිටියා. ඒ කිව්ව වගේ ම උමා එක්ක ඇයි හොඳයිය තියෙද්දි ම මුරුහන් සංවිදානෙ එක්ක එකතු උණා. සංවිදානෙ ඇස්වහලා හැමදා ම එළිවෙන පාන්දරට දුවගෙන එන මුරුහන්ගෙ බර දරාගන්න උමාගෙ යන්තං ඉස්සිච්චි පපුව ලැස්ති වෙලා හිටියා. ඒ හැම පාන්දරක ම උමාව තලල දාන මුරුහන් කුකුළෙක් අඬලනව ඇහිච්චි ගමං පිටිපස්සෙ දොර ඇරගෙන කැලේට පනින සද්දෙ අහං ඉන්න පුරුදු වෙලා හිටිය සිවගෝමිගෙ පපුව ඒ දුකට ම පැලිල යන්න වැඩි කාලයක් ගියෙ නෑ. ආණ්ඩුවෙ වාට්ටුවට දාලා ඉන්න අතරෙ පණ යන්න ඔන්න මෙන්න තියෙද්දිත් නවත්තන්නැතුව කියෙව්වෙ ම උමා ගැන කියල ඉඳල ඉඳල හරි ඉස්පිරිතාලෙ ගිහිං ගමට ආව හැමකෙනා ම කිව්වා. සිවගාමි මැරුණ ඉක්මණට ම පාර්වතී නිවුන් කෙල්ලො දෙන්නෙකුට පුංචිඅම්ම උණා.

★ ★ ★ ★ ★ ★

නන්දිකඩාල්වලට ආමි එකෙන් ගහල අන්තිම යුද්දෙ පටන් ගනිද්දි පාර්වතී වේලායුදන් හම්බ වෙන්න ගියා.

'තාත්තෙ මං ආමි එකට බාර වෙනවා..'

'උඹට පිස්සු ද? අනික උඹ බාර වෙච්චි ගමං උන් උඹට මොනාද කරන්නෙ කියල උඹ දන්නවද?'

'මට මේක කරන්න බෑ තාත්තෙ... තාත්ත කියපු හින්දා ආව විතරයි... මට දැන් යන්න ඕනි'

'උඹ ඉඳපං දුවේ.. අපිට සංවිදානෙන් ඇරෙන්න වෙන කාගෙන්වත් දැන් උදව්වක් නෑ. අනික උඹ වගේ යමක් කමක් තේරෙන එවින් තමයි සංවිදානෙට ඕනි... ආමි එක එක්ක හැප්පෙන්න උඹල වගේ කොල්ලො කෙල්ලො තමයි ඕනි දුවේ.. අනික සංවිදානෙට උදව් කරන කට්ටියට සංවිදානෙ සලකන හැටි උඹ දන්නවනෙ.'

'තාත්තෙ අපි රැවටිලා තාත්තෙ... මේක මහ බොරුවක්... සංවිදානෙ සලකන්නෙ ලොකු මනුස්සයට විතරයි... තාත්ත අපි වගේ මිනිස්සුන්ට කාගෙන්වත් උදව්වක් නෑ තාත්තෙ... මේ බොරුව මට අතාරින්නයි ඕනි.. මං යනවා.. මං ඒක තීරණය කරල ඉවරයි තාත්තෙ...'

'මං කියන දේ අහපං පාර්වතී... ආමි එකට බාර වෙච්චි එවින්ට මොනව වෙනවද කියල දන්නෙ නෑනෙ...'

'ගියපාර ගෙදර ගියා ම මට සුන්දරේ හම්බ උණා... දැන් අපේ කට්ටිය ගොඩ දෙනෙක් ආමි එකට බාර වෙලා¨... ඒ අය කෑම්ප්වලට අරං ගිහිං වවන්න කියා දෙනවලු... අන්තිමට අවුරුද්දකින් දෙකකින් ගෙවල්වලට බාර දෙනවලු... සල්ලිත් එක්ක...'

'සුන්දරලිංගම් තමයි උඹට මේව කියන්නෙ එහෙනං... මං ඌ ගැනත් බලාගන්නංකො...'

එකපාරට ම වෙඩි සද්දයක් ළඟ ළඟ ම ඇහෙන්න උණා. පාර්වතීගෙ අතින් ඇදගෙන වේලායුදන් දුවන්න හැදුවත් පාර්වතී වේලායුදන්ගෙ අත ගසල දාලා වෙඩි සද්දෙ ඇහිච්චි පැත්තට කෑගාගෙන දුවගෙන ගියා. එදායින් පස්සෙ උමා කවදාවත් ආයෙ වේලායුදන්ව දැක්කෙ නෑ.

පාර්වතී ආමි කෑම්ප් එකේ ඉඳන් ගෙදර ආවා. ඒ එද්දි තාත්ත හරි මුරුගන් හරි පාර්වතීගෙ පාර වෙනස් කරල ආයෙම විමුක්තිය හොයාගෙන කැළෑවට එක්කං යයි කියල බයෙන් පාර්වතී වෙව්ලුවා. ගෙට ගොඩවෙච්චි ගමං දුවගෙන ආපු උමා පිටිපස්සෙන් නිවුන් කෙල්ලො දෙන්න දණ ගාගෙන ආවා. උමාව බදාගෙන උරහිස උඩින් ඔලුව තියාගත්තු පාර්වතීගෙ ඇස් ගෙයි බිත්තිය උඩ එක තැනක නතර උණා. තාත්තගෙයි වේලායුදන්ගෙයි පින්තූර දෙක බිත්තියෙ එල්ලල චන්දන මාල දෙකක් දාලා තිබ්බා. ඒ පොටෝ දෙකේ ම 'වීර වණක්කම්' කියලා ලොකු අකුරෙනුත් 'කණ්ණීර් අංජලී' කියලා පොඩි අකුරෙනුත් ගහල තිබ්බා. මහාවීර පවුලක සාමාජිකාවක් වෙච්චි ආඩම්බරේ වහගෙන මහා තනිකමක එහෙම නැත්තං අනාරක්ෂාවක සේයාවක් පාර්වතීගෙ ඇස් ඉස්සරහ මැවි මැවී පෙනුණා.

'අපි තනි උණා නංගියෙ... මිනී දෙකවත් දැක්කෙ නෑ...'

හැන්දෑවෙ සුන්දරලිංගම් පාර්වතී ආව ආරංචිය එක්ක ම පාර්වතීගෙ ගෙවල් පැත්තට දුවගෙන ආවා.

'පාර්වතී පහුවෙල හරි කමක්නෑ මං කියන එක පිළිගත්ත එක ලොකු දෙයක්...'

පාර්වතීට අඬන්නවත් හිනාවෙන්නවත් හිතුණේ නෑ. ඒකට තාම කල්වැඩියි කියල පාර්වතීට දැනුණා.

'මං පාර්වතී ව බඳිනවා...'

ආයෙමත් පාර්වතීට අඬන්නවත් හිනාවෙන්නවත් බැරි තත්පර ගණනාවක් ගෙවිල ගියා...

'ඔයා වැඩිය එළිපහළියට යන්න එපා.. මං පාර්වතීව බඳින්න යනව කියන එකත් වැඩිය කාටවත් කියන්න එපා.. ලබන සෙනසුරාදා මං පාර්වතී ව එක්කං යනවා..'

ඒ කතාවට නං පාර්වතීට කතා නොකර ඉන්න බැරි උණා..

'එතකොට අක්කලා?..'

'මං ගැන කරදර වෙන්න ඕනි නෑ... උඹල පලයල්ලා... මට කෙල්ලො දෙන්න හදාගෙන ඉන්න බැරි නෑ පාරු...'

අක්කා පාර්වතීට පාරු කියල කතා කරන්නෙ අන්තිම බිංදුවට ම ආදරේ හිතුණා ම කියල පාර්වතී දැනං හිටියා..

ළඟ හිටිය පොඩි එකී බිම වැටිච්චි විස්කිරිඤ්ඤං කෑල්ලක් කටේ දාගන්න හදනව දැක්ක සුන්දරලිංගම් පොඩි එකී වඩාගෙන අහකට ගෙනිච්චා.

'කොහොමත් අපේ අම්මල පාර්වතීව බාරගන්න එකක් නෑ.. අම්මල කොහොම වෙතත් වාගීෂන් බාප්පලා තාම ඉන්නෙ නංගිල එක්ක තරහිං...'

වාගීෂන් විතරක් නෙමෙයි සංවිදානෙ එක්ක තරහිං හිටිය ගොඩක් අය මේ වෙද්දි සංවිදානෙන් ඇවිත් පුනරුත්ථාපනය වෙච්චි ඇයො හොය හොයා පළිගන්න එක මෝස්තරයක් වෙලා තිබ්බා. සටන

පාවලා දීපු ප්‍රතිගාමීන් විදියට හංවඩු ගැහිච්චි පාර්වතීලට සංවිධානෙ ඇතුළෙත් සහනයක් තිබ්බෙ නෑ ආයෙ ම. ඒ එක්ක ම වාගීෂන්ල වගේ ඊපීඩීපි එකේ ගම්මට්ටමේ හයිකාරයො වගේ ම කරුණාගෙ පැත්තෙ කට්ටියත් පාර්වතීලව කොන්දේසි විරහිත ව ප්‍රතික්ෂේප කරන්න දෙපාරක් හිතුවෙ නෑ. පාර්වතීලට ආයෙ සමාජ ජීවිතයක් උරුම කරගන්න එක නවත්තන්න ඒ දෙගොල්ලො ම දත කෑවා. මේ පැති දෙකට මැදි වෙච්චි ගමේ මිනිස්සු කෝකටත් තෛලෙ වෙච්චි හැඟීම් විරහිත හිනාවක් විතරක් දාලා පාර්වතීල මගාරින්න පටන් අරං තිබ්බා.

පහුවෙනිදා ම පාර්වතීව හොයං ආව සුන්දරේ කලබලේට උස්සන් ආව බෑග් එක සාලෙ තියල ෂර්ට් එක ගැලෙව්වා. පාර්වතී තේ කහට ටිකක් වක්කරන්න ගේ ඇතුළට ගියත් කන් දෙක උමාක්කයි සුන්දරලිංගම් ගාවයි තියල ආවා.

'මෝඩ හැත්ත.. මුංට තේරෙන්නෙ නෑ පාර්වතීලත් මිනිස්සු කියලා...'

'මං උඹට ඕකනෙ මල්ලියෙ කිව්වෙ... උඹ අපේ පව්වලට කර ගහන්න ඕනි නෑ... අම්මල තාත්තල කියන දෙයක් අහගෙන තව ඩිංගක් ඉගෙන ගනිං...'

'ඉගෙන ගෙන ආයෙ ආණ්ඩුවෙ රස්සා කරන්න ද උමාක්කෙ... මට ඕන්නැති රස්සාවක් නෑ... මට පාර්වතී හොඳා... මං ආයෙ ගෙදර යන්නෑ...'

පාර්වතීගෙ අත වැදිච්චි වීදුරුවක් 'ස්ලාං' ගාලා බිම වැටිලා ඒ කතාවට උත්තරයක් දුන්නා.

'පාරු.... පරෙස්සමෙන් කෙල්ලෙ.... මං හාල් ටිකක් කොරහට දැම්මා.. සුන්දරේ මල්ලිටත් එක්ක තව හාල් ටිකක් හෝදල ගනිං.. මං කඩේට ගිහිං සැමන් බාගයක් අරං ඉක්කංට එන්නං....'

සැමන් හොද්දයි, කොළ සම්බෝලෙයි, පපඩං බැදුනුයි එක්ක බත් තියල හදාපු පාර්වතීගෙ මංගල කෑම මේසෙ රෙද්දෙ රැලි නැති වෙන්න හතර කොණෙං ඇදපු පාර්වතී ආයෙම වතාවක් ඒක දිහා බලාගෙන තනියම හිනා උණා.

'තොපි කම්බස් කරනව යකෝ... අපේ කොල්ල නැති කරපු අවලං හැත්ත... උඩ ඉන්න දෙයියො බලා ගනියි යකෝ මේවා... පරට්ට වේසාවියො.... ගිහිං එක එකාලට අල්ලල අල්ලල මෙතන ආවද යකෝ මගෙ කොල්ල කාබාසිනිය කරන්න... තොපි හොයාගනිං ඒකට නාකි අස්පයෙක්'

වාගිෂන් බාප්පා ඉස්සර කරගෙන පාර්වතීලගෙ මිදුලට ඇවිත් සුන්දරලිංගම්ගෙ අම්මා කොණ්ඩේ කඩ කඩා කෑගහන්න ගත්තා. බය වෙලා අඬන්න ගත්තු පොඩි එව්වො දෙන්න වඩාගෙන උමා ගේ පිටිපැත්තට දිව්වා. සුන්දරලිංගම් අතට ගත්තු බත් කට පිඟානට දාන්නැතුව ගල් ගැහිලා. පුටුව පස්සට කරපු පාර්වතී ගේ ඉස්සරහට ගියා.

'පරට්ටියෙ.. මට මගෙ කොල්ල දීපං... තෝයි මහඑකයි ගියෙ ආණ්ඩුව එක්ක හැප්පෙන්න නේද යකෝ... කෝ දැං... කෝ තොපිලගෙ තිබිච්චි හයිය...වර එළියට පර බැල්....'

පාර්වතී ඉස්සරහට එනව දැකපු වාගීෂන්ගෙ කියවිල්ල නිකංම නැවතුණා.

'බාප්පෙ...'

තමන්ට සුන්දරේ සින්නකර අයිතියි කියල නිච්චියට ම දැනගෙන හිටිය පාර්වතී වාගීෂන්ට ඒ විදියට කතා කළා.

'මං සුන්දරේට කැමතියි... සුන්දරේ මට කැමතියි... මට ඒ හයිය ඇති... බාප්පල හිතං ඉන්නවනං අපිව වෙන් කරලා සන්තෝස වෙන්න සුන්දරේ එක්ක යන්න... මං ඒකට හරස් වෙන්නේ නෑ... මට අක්ක ඉන්නවා...'

'සුන්දරේ... වරෙං ගෙදර යන්න...'

'බාප්පෙ... බාප්පල යන්න... මං ආයෙ එන්නෙ නෑ...'

ගෙයි උළුවස්සට හේත්තු වෙන ගමං සුන්දරලිංගම් හෙමිහිට කිව්වා.

'උඹට එහෙනං පුතෙ වදාපු මට වඩා මේ පරට්ටිව ලොකු උණා නේද...'

'අම්මල කටවහං යනවද?...'

'වරෙං අක්කෙ මෙන්න මෙහෙ... මං මළාට මුන් එහෙම හතර මායිමේ වද්දගන්නව නෙමෙයි...'

වාගීෂන් ඒ විදියට කියාගෙන පහුබැහැලා ගියා. යනගමං තව මොන මොනාද කෑ ගගා කිව්වට පාර්වතීටත් සුන්දරලිංගම්ටත් ඒ මොකක්ද කියල ඇහුණෙ නෑ.

ගෙට ගොඩවෙද්දි මේසෙ උඩ තිබ්බ සැමන් හොදි පීරිසිය ලෙවකකා හිටිය පූසිව එළවපු පාර්වතී ආයෙත් සැමන් හොදි පීරිසියක් මේසෙට තියන්න අරං ආවා.

'කෝ උමා අක්කා... එන්න කියන්න අපිත් එක්ක ම බත් ටිකක් කන්න...'

සුන්දරලිංගම් පාර්වතීගෙ පස්ස පැත්තට තට්ටුවක් දාන ගමං කිව්වා.

★ ★ ★ ★ ★ ★

පාර්වතී බඩත් උස්සගෙන කඩපළට ආවෙ පාන් බාගයක් අරං යන්න හිතාගෙන.

බත් ඉදෙන සුවඳ එන කොට ඔක්කාරෙට එන එක මාස හයක් ගියත් මගැරිච්චි නැති එක ගැන සුන්දරලිංගම් හිටියෙ නෝක්කාඩුවෙන්.

'වෙන ගෑණුන්ට නං ඔච්චර අමාරු නෑ... උන්ට යස අගේට අවුරුද්දෙන් අවුරුද්ද ළමයි හම්බෙන්නේ... අපේ ගෑණුන්ට තමයි ඒකවත් බැරි...'

සුන්දරලිංගම් එහෙම කිව්වෙ පොඩි කෙල්ලො දෙන්නගෙ බඩවල් කිතිකවන ගමං.

සංවිදානෙ ඉන්න කාලෙ ගෙදර ආව වෙලාවක මුරුගන් අයියා උමා අක්කට බත් කටක් අනල කවපු හැටි දැකපු එක මතක් වෙලා පාර්වතීට ඉකියක් ආවා.

'මොන රෙද්දද්ද ඕයි... ඕනි එකකට නහය හූරන්න තියාගන්නෙ... තමුසෙ මහ මුස්පේන්තු ගෑණියක්නෙ..'

'සුන්දරේ.. මට ඔය සාලුව ගෙනත් දෙනවද?...'

උමා අක්කා ළඟක හිටං මහදවාලෙ නාන්න යන්න අරං තියෙනව කියල තේරුණු පාර්වතීට එකපාර අමුත්තක් දැනුණත් පුටුවක් උඩ දාලා තිබ්බ තුවායත් අරං ගේ පිටිපස්සට ගියා. උමා දරුවො දෙන්නෙක්ගෙ අම්මෙක් කියල හිතන්නවත් බෑ කියල පාර්වතීට හිතුණා. ගේ පැත්තට පස්ස හරවගෙන වැලේ රෙදි වන වනා හිටිය උමාගෙ ඇඟේ හැම ගෑණුකමක් ම දියරෙද්දෙන් විනිවිද පේන්න තිබුණා.

'කෝ... ඇයි සුන්දරේ මල්ලි නැද්ද?? කන්නෙවත් නැතුව කොහෙ ගියා ද??...'

'සුන්දරේ ගෙයි නෑ...'

පාර්වතී බොරුවක් කිව්වා.

'මේ ගෑණිට මොන යකෙක් වැහිලද? මං පොඩි එව්වො දෙන්න තියල සාලුව දෙන්න බලද්දි ඒක උස්සං ඇවිල්ලා. බඩකුත් තියාගෙන මොන මගුලක් නටනවද මන්දා...'

කුස්සියෙ දොරගාවට ආව සුන්දරේ පාර්වතීට කෑගහන්න තියාගත්තා.

'ඒකනෙ පාර්වතී.. සුන්දරේ මල්ලිට කිව්වනං ඕක ගෙනැල්ල දෙනවනෙ.. නේද මල්ලියෙ...'

එහෙම කියාගෙන උමා සුන්දරේගෙ ඇඟේ ගෑවිගෙන ගේ ඇතුළට ගියේ තෙත බේරි බේරි. දෙන්නෙකුට ලේසියෙන් එහා මෙහා වෙන්න පුලුවන් උළුවස්සක් තියෙද්දි උමාක්කා හිතාමතා ම සුන්දරේගෙ ඇඟේ හැප්පුණාද කියල සැකයක් පාර්වතීගෙ හිතේ ඇතිවෙලා නැතිවෙලා ගියා.

මාත් මේ මොනා හිතනවද මන්දා කියල හිත හිතා පාර්වතී කඩේ පැත්තට යන්න පිටත් උණා. පපුවෙ මයිල් ඇද ඇද පාර දිහා බලං හිටිය සුන්දරලිංගම් දිහා ආයෙ හැරිල බලන්න හිතුණත් පාර්වතී ඒ හිත නවත්ත ගත්තා.

'නැන්දෙ පාන් තියෙනවද...'

'පාන් නං තියෙනව... ඇයි කෙල්ලෙ... පාන් කාලා ඇතෑ ඔය කාලෙට. හොඳ කොළ මැල්ලුමක් එක්ක මාලු හොද්දක් එක්ක බත් ටිකක් කෑවනං තමයි ඉපදෙන්න ඉන්න දරුවගෙ මොළේ පෑදෙන්නෙ...'

'කන්න බෑ නැන්දෙ... අතගාලා අතගාලා ඉව්වා ම කටේ තියන්න බෑ අප්පිරියයි...'

'ඇයි බං උමා කෙල්ල නෙමෙයි ද උයන්නේ...'

'අක්කට කෙල්ලො දෙන්න එක්ක උයන්න කරන්න බෑනෙ නැන්දෙ...'

'මං උදේ හන්දියට යමිං ගමං බලාගෙන ගියෙ... දැන් සුන්දරේ කොලුවත් රස්සාවට යන්නෑ නේද??'

'ඔව් නැන්දෙ... මේ ටිකේ මූද සැරයි කියන්නේ... අනික මටත් හදිසියක් උණොත් කවුරුවත් නැති හින්දා සුන්දරේ රස්සාවට යන්නෙ ඉඳල හිටල දවසක විතරයි...'

'උඹලට කොහොම වෙතත් උමාට නං දැන් ළඟකදි ඉඳං හිටි හිටි ගමං හදිස්සි වෙනව කියල ආරංචියි...'

පාන් බාගයක් කපල පත්තර කෑල්ලක ඔතල දෙන ගමං කඩේ නැන්දා හීන් සද්දෙට කිව්වා. පාර්වතීගෙ ඇඟ ඇතුළෙන් විදිලියක් කොටාගෙන යනව වගේ දැනුණත් ඒ විදිලියට මූණට එන්න පාර්වතී ඉඩ දුන්නෙ නෑ.

'නැන්දෙ... සම්බෝල පැකට් නැද්ද??'

'ඔය කොයි කොයි එක ගැනත් ටිකක් හෙවිල්ලෙන් හිටියනං නේද හොඳ... උඹල ඉතිං කොළඹ ආණ්ඩුව එක්ක හැප්පෙන්න ගියා උණාට ගෑණු මිනිස්සු එක්ක හැප්පිලා පුරුද්දක් තියෙන්න විදියක් නෑනෙ... හිටිං කෙල්ලෙ... මං උදේ උයාපු මාලු හොද්දක් තිබ්බා.. ටිකක් අරං එන්නං... ගෙනිහිං කාපං...'

පාර්වතී කඩේ දැල් ටික හූර හූර ඇස් දෙකට ආපු කඳුළු බිංදු ටික නවත්තගන්න හැදුවා.

'ඉඳා පාර්වතියෙ... මේක අරං පලයං... තමංගෙ කියල අම්ම අප්පවත් විස්වාස කරන්න බැරි කාලයක් බං මේක... ඒක ඔළුවෙ තියාගෙන කල්පනාවෙන් හිටපං...'

පාර්වතී මොකුත් නොකියම කඩෙන් බැහැලා ආවා.

'නංගියෙ උඹ ඊයෙ රෑත් කෑ ගැවෙ... කොන්ද එහෙම රිදෙනවද??'

'ඩිංගක් විතර කොන්ද රිදෙනව අක්කෙ.. ගාණක් නෑ...'

'එහෙම කියන්නෙපා බං.. අමාරුවක් තියෙනවනං ගිහිං වාට්ටුවෙ නැවතියං.. නේද සුන්දරේ මල්ලියෙ.'

'අන්තිමට මෙතන මහරැ උන්හිටි ගමං හදිසියක් උණොත් අරං යන්න වාහන තියෙන එකක් යෑ... බයිසිකලෙ පදින්න පුලුවන් දුරක් යෑ පාර්වතී...'

පාර්වතීට ඒ එක්ක ම කොහෙදෝ තිබ්බ කොන්දෙ අමාරුවක් දැනෙන්න ගත්තා. ළඟ තිබ්බ පුටුව ඇදගෙන වාඩි වෙච්චි පාර්වතී සුන්දරේගෙ ඔක්කෙ වාඩි වෙලා හිටිය පොඩි එකීට කතා කළා.

'එන්න පුතේ... පුංචි ගාවට එන්න...'

'මට ඔය මොනා හරි රත්කරල සුන්දරේ මල්ලිට දෙන්න බැරියෑ... මල්ලිටත් රස්සා යන්න බැරියෑ එතකොට... නේද මල්ලියෙ..'

උමා අක්කා කියන කියන එකට නේද මල්ලියෙ කියන එක දැන් ඕනිවට වැඩියි වගේ කියල පාර්වතීට හිතුණා.

එදා හවස ම ගිහිං ඉස්පිරිතාලෙ නවතින්න පාර්වතී තීරණය කළා.

⋆ ⋆ ⋆ ⋆ ⋆ ⋆

සතියකට කලින් ළමය හම්බ උණා.

පාර්වතී බලන්න සුන්දරේ ආවෙ දවස් තුනකට පස්සේ.. ඒ උමා එක්ක. ළමයි දෙන්න වඩාගෙන දෙන්නත් එක්ක වාට්ටුවට ඇතුළු වෙද්දි පාර්වතීට මොකක්ද හිතන්න ඕනි කියන එක හිතාගන්න බැරුව ගියා.

'යකඩෝ.. තව කෙල්ලෙක්... සුන්දරේගෙ මූණමයි... මේං... මේ නාස් පොල්ල... සුන්දරේගෙ වගේමයි... සුන්දරේගෙත් පොඩි කාලෙ මේ විදියට ම කෙස් ටික කැරලි ගැහිල තිබ්බ කියල සුන්දරේලගෙ අම්මා ඒ දවස්වල කියල තියෙනව නංගියෙ...'

පාර්වතී පොඩි එකීගෙ මූණ ඉම්බා.

'මං ඕනි වෙද්දි තබෝදිනීලගෙ කාර් එක කතා කරගෙන එන්නං... ඔය කිව්වට තව සුමානෙකට දෙකකට ටිකට් කපයි ද දන්නෙ නෑනෙ...පණ්ඩිතකමට ගෙදර දුවගෙන එන්න එහෙම හදනව නෙමෙයි...'

එදා උදේ ටිකට් කැපුවා කියල සුන්දරේට කියන්න පාර්වතීගෙ කට ඇරුණෙ නෑ.

'හ්ම්..'

වැඩි කතාබහක් නැතුව විනාඩි දහයක් විතර ඇඳ ගාව හිටිය සුන්දරලිංගම් ගමේ තව ලෙඩෙක් ඉන්නව කියල වෙන වාට්ටුවකට ගියෙ මූණ දෙන්න බැරිකමකින්ද කියල පාර්වතීට හිතුණා.

'නංගියෙ... උඹ බලෙන් එහෙම ටිකට් කපාගෙන එනව නෙමෙයි... පළවෙනියනෙ.. අනික අඩුමාසෙන් හින්දා ටිකක් පරිස්සං වෙන්න වෙයි.. දොස්තර මහත්තේල කියන දවසක ම වරෙං.. අපි දෙන්න උඹව බලන්න පුලුපුලුවන් විදියට එන්නං...'

'දෙයියනේ කියලා තව වැඩි දවසක් ඉන්න වෙන එකක් නෑ අක්කේ...'

ආයෙමත් පාර්වතී බොරුවක් කිව්වා.

⋆ ⋆ ⋆ ⋆ ⋆ ⋆

ගෑණු වාට්ටුවෙ ඇඳන් මදි හින්දා ටිකට් කපපු අයට ගෙවල්වලට යන්න කියාගෙන නර්ස් නෝන කෙනෙක් පණිවිඩේ කියාගෙන ගියා. බෑග් එකට රෙදි ටික අහුරන ගමං පාර්වතීගෙ ඇස්දෙකෙන් කඳුලු වැක්කෙරෙනව දැකපු අල්ලපු ඇඳේ හිටිය ලෙඩා පාර්වතීට කතා කළා.

'නංගියෙ... මහත්තයා එන්නං කිව්ව නේද එක්ක යන්න.. නර්ස් නෝනට කියල තව ටික දවසක් ඉඳපං... නැත්තං හෙට අපේ එක්කෙනා ආවා ම මං කියන්නං උඹලවත් ගෙවල් පැත්තට ගෙනිහිං අල්ලල එන්න කියලා...'

නවත්තගන්න හදපු කඳුලු ගංගාවක් වෙලා ඇස්දෙකෙන් එළියට විසිවෙද්දි පාර්වතී පොඩි එකීව හයියෙන් තුරුලු කරගත්තා.

'ඇයි බං මේ... ඔය පොඩි එකා තලන්නෙපා යකෝ... අපේ පවුවලට පොඩි එව්වො පළි නෑ බං...'

පාර්වතීට දරුවව බිමිං තියන්න හිතුණෙ ම නෑ. දරුව අඬන්න තියාගත්තු හින්දා පාර්වතී බෑග් එක පුටුව උඩ තියල ආයෙ ම ඇඳේ හාන්සි උණේ තනේ පොඩි එකීගෙ කටේ තියන ගමං. පොඩි එකීගෙ ඇස් පියවිගෙන එද්දි

හෙමිහිට පොඩි එකී ව ඇකෙන් තියපු පාර්වතී හැට්ටෙ කටුටික හද හදා නර්ස්නෝනල ඉන්න කාමරේ පැත්තට ගියා.

පාර්වතී ආයෙමත් ඇඳගාවට ඇවිත් කොණ්ඩෙ පීරන්න ගත්තා.

'අක්කෙ මං යන්න කියලා'

'තනියම??? උඹට පිස්සු ද??'

'මට තනියක් නෑ අක්කෙ... අනික බස් එක තියෙනවනෙ හන්දිය ගාවට ම.. ඔහෙ දවල් වෙන්න කළින් යාගත්තැකි...'

'දැන් හැඳෙන එකීලටත් තියෙන්නෙ ලේසි ගායක් නෙමෙයි යකෝ...'

තව ටිකක් කුටු කුටු ගගා අල්ලපු ඇඳේ ලෙඩා අනිත්පැත්ත හැරුණත් පාර්වතීට තරහක් ආවෙ නෑ. ළඟට ගිහිං ඒ ඇඳේ කට උල් කර කර හිටිය අලුත උපන් කොලු පැටියගෙ ඔලුව අතගාලා නළල ඉම්බා. පිරිච්චි කොලු පැටියා. පාර්වතීට යන්තං අතපය හතර බේරිච්චි තමන්ගෙ පොඩි එකී දිහා බලද්දි හීල්ලුණා.

'පරෙස්සමට පලයං නංගියෙ... බස් එක නෑ කියල එන එන ලොරිවලට එහෙම නගිනව නෙමෙයි... ආයෙ වාට්ටුවට වරෙං...'

'හ්ම්...'

හිනාවෙලා බිම බලාගත්තු පාර්වතී වාට්ටුවෙන් එළියට ආවා.

★ ★ ★ ★ ★ ★

පාර්වතී පොඩි එකීත් වඩාගෙන බෑග් එකත් එල්ලං ගෙට ගොඩවෙන කොට උමා පේන්න හිටියෙ නෑ. පාර්වතී දරුවත් එක්ක ම ගේ පිටිපස්ස පැත්තට ගියා. උමා නාගෙන ඇවිත් රෙදි වනනවා.

'අක්කෙ, කෝ සුන්දරේ...'

සුන්දරලිංගම්ගෙ හෝදපු යට කලිසමක තෙත මිරික මිරික හිටිය උමා ගැස්සිලා ගියා.

'යකෝ... උඹ ආවද නංගියෙ... අපි මේ හෙට එන්න හිටියෙ.. සුන්දරේ ඔය හන්දිය පැත්තට ගියෙ තබෝදිනීලගෙ කාර් එක කතාකරගන්න කියලා.'

යට කලිසම වැලේ වනපු උමා වතුර බාල්දියත් අරං ගෙට ගොඩ උණා. සතියට දෙකට උමා තව ටිකක් ආරලා කියලා පාර්වතීට හිතුණා.

පාර්වතී ගේ ඇතුළට යද්දි උමා කාමර කැල්ලෙන් එළියට ආවා.

'ආං.. මං පොඩි එකාව තියන්න වීත්ත කැල්ල දිගෑරල ආවා...'

පාර්වතී පොඩි එකීව වඩාගෙන කාමරේට ගියපු පාර්වතී පොඩි එකීව වීත්ත කැල්ලෙං තිබ්බා. ඊට එහාපැත්තෙ හිටිය පොඩි උන් දෙන්නා සැපට නිදි.

කාමරේ මුල්ලක සුන්දරලිංගම්ගෙ සරමක් වළල්ලක් විදියට බිම වැටිලා තිබ්බා. පාර්වතී ඒ මුල්ලට යද්දි ම පොඩි එකී කෑගාන්න තියාගත්ත හින්දා සරම එහෙමම තියෙද්දි පාර්වතී පොඩි එකී ගාවින් හාන්සි උණා.

කෙල්ලොම තුන්දෙනෙක්. දීග දෙද්දි ලේසි වෙන්නේ නෑ. පාර්වතීට පොඩි එවුවො තුන්දෙනා ගැන ම එක විදියෙ කැක්කුමක් දැනුණා. පොඩි එකීගෙ කටේ තිබ්බ තන පුඩුවෙන් විතරක් නෙමෙයි පාර්වතීගෙ අනිත් තනෙනුත් එක ඕසෙට කිරි වැක්කෙරෙන්න ගත්තා. ඒ එක්ක ම කොහෙදෝ නැති හයියක් යටිපතුල්වලින් ඇඟට ඇතුළු වෙලා යටිබඩ පපුව දිගේ ඔලුවට ගිහිං ඇගේ හැම නහරයක් ගානෙ ම දුවං යනවා වගේ පාර්වතීට දැනෙන්න ගත්තා.

'අක්කෙ කෝ අර උදැල්ල...'

'ඒ ගමන මොනා කරන්නද හදන්නෙ....'

'ගේ පිටිපස්සෙ කැලෑව වැවිල වැඩියි වගේ දැක්කා.. නිකං ඉන්න එකේ සුද්ද කරලවත් දාන්න...'

'කෝ... පොඩි එකී නිදිද?'

'ආං අක්කල දෙන්න එක්ක සනීපෙට නිදි. තුන්දෙනාට ම මං සුන්දරේගෙ සරමක් පෙරෝලා තිබ්බා.. මදුරුවො දැන් දවල් හිටං අක්කෙ...'

'පාරු...?'

'අක්කෙ හාල් ටිකක් ලිපේ තියපංකො... මං වම්බටු ගෙඩි තුනහතරක් කඩාගෙන ම එන්නං.. සුන්දරේ ආවා ම වැල්ලට යවල මාලු වැලක් ගෙන්න ගම්මු...'

එහෙම කියල පාර්වතී ගෙයිං එළියට බැහැලා ගිහිං ආයෙ ගෙට එද්දි සුන්දරලිංගම් ආ පිම්මෙම වැල්ලටත් ගිහිං.

වම්බටු හොද්ද ලිපේ තියාපු පාර්වතී කුස්සියෙ දොරෙන් බලද්දි සුන්දරලිංගම් උමා අතට මාලුවැල දීල ආයෙම

බයිසිකලේට ගොඩවෙනවා දැක්කා. උමා එක්ක මොන මොනාද කතා කරපු සුන්දරලිංගම් සිවුරුහන් ගහගෙන පාරට යනව බල බල පාර්වතී ලිපට පිම්බා.

'නංගියෙ මං මේ මාලු හොද්ද ලිපේ තියන්නං... උඹ පලයං ළමයි තුන්දෙනා ළඟට...'

'කොහෙද අරය ගියේ...?'

'කවුද? සුන්දරේ ද? වාගීෂන් බාප්පලගෙ කෙල්ල කොටහලු වෙලාලු... ඒකට හට් එක ගහන්න තියෙනව කියල ගියේ... අම්මලටත් පණිඋඩේ කියයි මං හිතේ.. එහෙම උණොත් හෙට දිහාවෙ එයි මේ පැත්තෙ කෙල්ල බලන්න...'

⋆ ⋆ ⋆ ⋆ ⋆ ⋆

'පාර්වතියෙ.... පාර්වතියෙ....'

සුන්දරලිංගම් ළඟින් අරක්කු ගඳක් පාර්වතීට දැනුණා.

'කෝ මයෙ කෙල්ල...'

'අරක්කු බීල නං මයෙ පොඩි එකී වඩාගන්නව නෙමෙයි...'

පාර්වතී සුන්දරලිංගම්ගෙ අතට හීන් පාරක් ගහන ගමං කිව්වා.

'උමා... කන්න ටිකක් බෙදල ගනිං බං...'

බත් ටික උඩින් පල්ලෙන් කාපු සුන්දරලිංගම් සාලෙ ඇඳේ තිබ්බ පැදුර කෙල්ලො තුන්දෙනා නිදාගෙන හිටි තැන බිම එළලා දාලා ඒකෙ හාන්සි උණා.

'පාරු... උඹත් නිදාගනිං...'

'නෑ අක්කෙ.. මේ ටික අස්පස් කරල දාලා මං එන්නං... උඹ ගිහිං නිදාගනිං...'

පාර්වතී වළං දෙකට වතුර පුරවල පිළිකන්නෙන් තියල කාමරේට ආවා.

දරු තුන්දෙනාටයි සුන්දරලිංගම්ටයි මැද්දෙ තිබ්බ ඉඩ ඩිංගෙ පාර්වතී හාන්සි වෙද්දි සුන්දරලිංගම් තව ටිකක් එහාට වෙලා පාර්වතීට ඉඩ දුන්නා. රෑ මැද්දක් වෙනකං ඇහැ පියවෙච්චි නැති පාර්වතීට වේගෙන් වේගෙන් ඇහිච්චි උමාගෙ හුස්ම සද්දෙ කොයිවෙලේ මේච්චල් උණාද කියල මතකයක් තිබ්බෙ නෑ.

හතර වටෙන් එළිය වැටිල කියල දැකපු පාර්වතී සුන්දරලිංගම්ගෙ කකුළ හීන් සීරුවෙ අයින් කරගෙන නැගිට්ටද්දි සුන්දරලිංගම් කෙඳිරිගාගෙන අනිත් පැත්ත හැරුණා.

පාර්වතී වතුර ලිපේ තියලා සීනි බෙලෙක්කෙ අතට ගත්තා. සීනි ඇටයක්වත් ඒකෙ නෑ කියල දැකපු පාර්වතී කාමරේට ගිහිං සුන්දරලිංගම්ගෙ කමිස සාක්කුවට අත දාන ගමං ආයෙමත් පැදුර දිහා බැලුවා. උමාගෙ පපුව උඩින් අතක් දාගෙන සුන්දරලිංගම් ආයෙ නිදි.

⋆ ⋆ ⋆ ⋆ ⋆ ⋆

තබෝදිනීගෙ කතාව මතක් උණ පාරට පාර්වතීට ආයෙමත් හිනා ගියා. කට හෝදගත්තු උමා පාර්වතී දිහා බලාගෙන හිටියා.

'මොකෝ බං තනියම හිනාවෙන්නේ...'

'අක්කෙ ආ තේ එක...'

'පාරු... සුන්දරේට තේ වක් කළේ නැද්ද?'

'මේ ජොග්ගුවෙ තියෙන්නේ... උඹම ගෙනිහිං දියං අක්කෙ...'

උමා ඇස් දෙක උඩ තියාගෙන පාර්වතී දිහා බලං හිටියා.

'පාරු.... මට සමාවෙයං නංගියෙ....'

පාර්වතීව බදාගත්තු උමා මහ හයියෙන් අඬන්න ගත්තා.

'හරි හරි.. නාඩ හිටිං අක්කෙ... අර පොඩි එවුනුත් ඇහැරෙයි බං දැන්...'

පිටිඅල්ලෙන් කඳුලු පිහිදගත්තු උමා තේ එකත් අරගෙන කාමරේට යනව බලං හිටිය පාර්වතී ලිපේ ගිනි අඟුරු ටික ඇදල දැම්මා. ඒ එක්ක ම පාර්වතී හෙමිහිට පොඩි කාලෙ කියවපු පොතක තිබ්බ තිරුක්කුරලක් හෙමිහිට මිමිණුවා.

'කෙට්ටාලුම් මේන් මක්කල් මේන් මක්සලේ සංගු

සුට්ටාලුම් වෙණ්මෛ තරුම්'

පාර්වතීටත් නොදැනෙන්න එළියට ආපු කඳුලක් වැටිල ගිනි අඟුරක් චස් ගාලා නිමිල ගියා.

# වෙනස් වූ මං පෙතක පරිපාලකයින්

වී විටෙක ජයගොස, විටෙක බාධක
ප්‍රමුඛ සේවයේ නිබඳ බැබළ
වෙනස් තැන්වල රඳා මතකය
එකළු කරවා සැවොම සමඟින්

රටෙහි සිව් කොණ නොඅලස්ව සැමදින
සියල් වැඩ එක ලෙසට උගනිමින් කඩිසරව
රටවැසියන්ටම කැපවුණු
පරිපාලකයා වෙයි තුන්කල්හිම දකින

උස්මිටිකම් නොසලකාය
වත බස ගොස නොම සිතාය
සප්ත මහලින් මැටි පැලටත්
සැම එක ලෙස ගෙන සිතාය

රාජකාරිය දේවකාරියැයි සිතමින්
නවමු දැනුමින්, නව මංපෙත් පෙහෙලි කරමින්
අදටත් හෙට දිනටත්
නංවමු ජය කෙහෙලි ලක් මවුන් නමින් මතුවටත්

**එරංග නිරෝෂාන් දයාරත්න**
සහකාර ලේකම්
(ව්‍යාපෘති කළමනාකරණ හා ප්‍රසම්පාදන)
මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය

# නුහුරු නුපුරුදු...

නුදුටු නුපුරුදු නොදත් ලෝකයක්...
ඇත්තමයි නුහුරුයි වෙලාවකට
හිතෙනවා ඉන්නවද මෙහෙමත් අය
දිය යටින් ගින්දර ගෙනියන්න හැකි...
අනෙකාගෙ දුක දැක සිනාසිය හැකි...
කෙනෙක් වැටුන විට සතුටු වෙන්න හැකි...
තමන්ගේ දොස් නොදකින අනුන්ගේ දොස් දකින...
ඇත්තමයි හරිම පුදුමයි...
ඇයි තවත්,
ඉන්න හිටින්න තැනක් නැති...
දරුවෝ හිටියට සලකන්නෙ නැති...
කන්න අඳින්න අඟහිඟ ඇති...
බිම් අඟලට මනුස්සකම් යටවුණ...
බොහෝ මිනිසුන්...නොමිනිසුන්...
එවන් බොහෝ දෙන අතර
හදවතින් සිනාසෙන...
හිතට එකඟව වැඩ කරන...
වංචාව පිළිකෙව් කරන...
අවංක මිනිසුන් ඇති
ලෝකයක් දකින්නට..
පාරමී පුරන්නෙමි....

**අයෝධ්‍යා රණසිංහ**
සහකාර ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අයගම

# පවුරු බැඳගෙන සුසුම්ලන හැටි...

ඉර දිහා නෙත් බැලුම්ලන්නට බැරි තරම් ඉර හරි සැරයි
සඳ දිහා නෙත් බැලුම්ලන්නට බැරි උනේ නැති ඉසිඹුවයි
තරු පොකුරු දෙස බලන විට ඒ තරුත් තව දුරටම ඇදෙයි
මදක් නතරව වෙහෙස නිවනට තිබුණ නම් හොඳ බව සිතෙයි

කන්න බොන්නට කොහේ හෝ නිදහසේ ඇවිදින්නට බැරී
නින්ද දෑසට නොඑන තරමට නෙතු පියන් ඇත නිදි වැරී
ජීවිතේ යන අතක ගියදෙන් නවතින්න හැකි නම් හරී
කියල හිතමින් තව දුවනවා හති වැටෙද්දිත් ගෙන දිරී

සෙවනැල්ලවත් නොමැත තනියට සණ අඳුර රජයන වෙලේ
එළිය ඇති කල ළඟම දැවටෙන පිරිවරක කිම ඇති පලේ
ජීවිතය යැයි සිතා මොහොතින් මොහොත මරණය වෙත ඇලේ
සැඟවුණත් මොන දීප දේසෙක නොපෙනේද මරුවගෙ බලේ

අඳුරු කළු සළු පට ඉරාගෙන පෙරඹරින් හිරු එබෙන විටදී
මැදුරු මාළිග සඳළුතලවල් සේම පැල්පත් එළිය වෙද්දී
සිදුරු කරගෙන හදවතින් හදවතට මල් සර හී විදිද්දී
පවුරු බැඳගෙන සුසුම්ලන හැටි ලොවම එළියේ හිනා වෙද්දී

**යමුනා තුෂාරි රාජරත්න**
නියෝජ්‍ය කම්කරු කොමසාරිස්

# ඇදුරු සඳ...

පිච්චෙන්න ළඟ තරම් දැනෙන අව් ගිනි    මැදින්
ඉරා දූවිලි වලා කුඩේ මායිම    යටින්
සූට්කේසය අතින් ශිල්ප බර ගෙන    හිතින්
ගෙවා සැතපුම් ගණන් ඇදුරු වැඩියා    පයින්.....

ගිය කන්නෙ වේලිච්ච අප්පච්චිගේ    හේන
වගේ වූ හිතට වැහි පොදක් වී තෙත්    කරන්
මියෙන තක්සලාවට හුස්ම ඩිංගක්    අරන්
පණ පිඹින්නට ඇදුරුතුමන්    වාසනාවන්.....

ශිල්ප දෙන හැටි අපට පින් බිඳක්    අයකරන්
විසිහතර පැය මදි ව ඔබ වෙහෙසවන    තරම්
රළු කටුක අපේ මඟ කටු පඳුරු වැල්    මතින්
මල් පිපෙනු දැකලා ද හීනයක් වත්    ඉතින්......

කියන්නෙමි ගුණ වරුණ අම්මාට    උයනකම්
අසන්නට බැරි තරම් රිදෙන තෙක් ඇගෙ    සවන්
අකැප වූ ඉංගිරිසි අකුරු හැඩ කර    රවුම්
නංගීට කියා දෙමි මිදුලෙ වැලි මත    ලියන්......

හිරු දෙයියො වඩින විට වැව් දියට    හිනැහෙමින්
ඇදුරුතුමනි ඇත්තමයි, මල් පිපෙන ඔබෙ    නමින්
පැදුර විසිකර නැගිට ඒ පිපුන මල්    නෙලන්
පාසලට දුවන් එමි ලද නිසා මඟ    ඔබෙන්.....

**කේ.ජී.එස්.එස්. කෝරළගේ**
සහකාර ලේකම්
ආණ්ඩුකාර කාර්යාලය, සබරගමුව පළාත් සභාව

# 36th Executive Committee of Sri Lanka Administrative Service Association 2019/2020

President
**B.K. Prabath Chandrakeerthi**
Attorney-at-law

Secretary
**P.P.S. Rohana de Silva**

Treasurer
**K.P. Yogachandra**

Editor
**Sudharma Karunarathna**

National Organizer
**Dr. K.A.S. Keeragala**

Deputy Presidents
**S.J. Kahawatta**
**M.B.L. Rahuman**
**R.G. Janaka Premarathna**
**R.M.N.K.S. Kanchane**
**Buddhika Jayathissa**

Deputy Secretary
**Manoj Amarasinghe**

Assistant Secretary
**Chinthaka Abeykoon**

Assistant Treasurer
**W.W.K.J. Fernando**

Assistant Editor
**Sehu M. Al Ameen**

Committee Members
**G. Prasanna J.Kumara**
**Priyanga Nanayakkara**
**D. Widanagamachchi**
**Asanga Deshapriya**
**Dulip Somirathna**
**Suranga Ranasinghe**
**Arjuna Rathnayake**
**M.A.S. Madusanka**
**S.D. Thewarapperuma**
**B.S. Kekulawala**
**N.A.P.S.S. Wickramasinghe**
**R.P. Iresha Udayangani**
**Dasun Rajapaksha**
**G.K.S. Pushpakumara**
**J.K. Neranjala Dilhani**